# එස්.බී.ඩී. ද සිල්වාගේ දේශපාලන ආර්ථික දර්ශනය පිළිබඳ දළ විග්‍රහයක්

**සමන් පුෂ්පකුමාර**

**හැඳින්වීම**

20 වන සියවසේ ශ්‍රී ලංකාවේ බිහි වූ ශ්‍රේෂ්ඨතම දේශපාලන ආර්ථික විද්‍යාඥයා අප අතරින් වියෝ විය. ඒ ආචාර්ය එස්.බී.ඩී. ද සිල්වා ය. ඔහු මාක්ස්වාදී පසුබිමකින් යුක්තව ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් පුලුල් හා දීර්ඝකාලීන හැදෑරීමක් කළේ ය. එස්.බී.ඩී. තම වෘත්තීය ජීවිතය ආරම්භ කළේ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි. පසුව කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනයේ නියෝජ්‍යය අධ්‍යක්ෂ ධුරයට පත් විය. මැලේසියාවේ පෙනැන්ග් විශ්වවිද්‍යාලයේත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත් කථිකාචාර්යවරයෙකු වශයෙන් ඔහු කලක් සේවය කර ඇත. 1954 දී ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලය මගින් ප්‍රකාශනයට පත්කළ *Long-term Contracts and Bulk Trading* කෘතියේත්, 1962 දී ලන්ඩන් විශ්වවිද්‍යාලය මගින් ප්‍රකාශනයට පත් කළ *Investment and economic growth* කෘතියේත් කතුවරයා ඔහු ය. නමුත් ඔහුගේ විශිෂ්ඨතම කෘතිය වූයේ, 1982 දී ප්‍රකාශනයට පත්කළ *The Political Economy of Underdevelopment* ය. මෙම කෘතිය තුළ ඌණ සංවර්ධනයට අදාළ අභ්‍යන්තරික හා බාහිර සාධකයන් සහවාදයකට ගෙන ඇත. ඌණ සංවර්ධනය පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් තිබුණ සීමිත ශ්‍රී ලාංකිකයන් කිහිපදෙනා අතරින් එක් අයෙකු වූයේ එස්.බී.ඩී. ය. ඔහුගේ ආර්ථික දර්ශනය ශ්‍රී ලංකාවේ ආර්ථිකය සමස්තයක් වශයෙන් මුහුණ දී තිබෙන ගැටළුවත්, මේ ගැටළුව ජයගන්නේ කෙසේ ද යන්නත් පැහැදිලි කරන්නකි. 2018.06.15 දින මිය යන තෙක් ඔහු පිළිතුරු දීමට උත්සාහ කළේ මේ ගැටළුවට ය. එක් ගැටළුවක් ඉතාම ගැඹුරු

ආකාරයෙන් හැදෑරීමට ඔහු තම ජීවිතය තුළ සකසා ගත් ශාස්ත්‍රීය විනය අතිශයින් පුදුමාකාර ය. ඔහු ලංකාවේ අර්ථිකය සම්බන්ධයෙන් නැගූ ප්‍රධාන ප්‍රශ්නයේ ආදීනව අද අපි භුක්ති විඳිමින් සිටිමු. කාර්මික නිෂ්පාදනයක් නොකර සේවා ආර්ථිකයක් පිම්බීමේ අනිටු ප්‍රතිඵල අපි අත්විඳිමින් සිටින්නෙමු. ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් ඔහු නැගූ ප්‍රශ්න දේශපාලන ආර්ථික වශයෙන් පමණක් නොව සමාජ විද්‍යාත්මක වශයෙන් ද වැදගත් ය. ඔහු සිය ආර්ථික විද්‍යාත්මක දර්ශනය ගොඩනගා ගැනීමේදී පරිශීලනය කළේ දේශපාලන ආර්ථික විද්‍යා කෘති පමණක් නොවේ. දාර්ශනික හා සමාජ විද්‍යාත්මක ලිපි ලේඛන කොතරම් දුරට පාවිච්චි කර තිබේද යන්න ඔහුගේ *The Political Economy of Underdevelopment* කෘතිය කියවීමෙන් පරීක්ෂා කළ හැකි ය. මෙම ලිපියෙහි අරමුණ වන්නේ එස්.බී.ඩී. ද සිල්වාගේ දේශපාලන ආර්ථික දර්ශනයේ පැති මානයන් කිහිපයක් හෙළදරව් කිරීම ය. ඔහු විශාල වශයෙන් ලියන ලද නමුත් ඒවා නැවත නැවතත් සංස්කරණය කිරීමත්, ප්‍රකාශනයට පත් නොකිරීමත් නිසා ඔහුගේ සමස්ත අදහස් සංයුක්ත වශයෙන් දැක්වීම අපහසු ය. නමුත් ඔහුව දිගු කාලයක් ආශ්‍රය කිරීමෙන් ඔහුගේ අදහසේ සාරය ඔහු ආශ්‍රය කළ කිහිප දෙනෙකු වටහා ගත් බවට සැකයක් නැත. වසර 15 ක් සමඟ ඔහුව ආශ්‍රය කිරීමෙන් ඔහුගේ දේශපාලන, ආර්ථික චින්තනය සම්බන්ධයෙන් ලබා ගත් අවබෝධය මෙහි දී සම්පිණ්ඩනය කිරීමට උත්සාහ ගනිමි. ඔහුගේ ශාස්ත්‍රීය ක්‍රියාවලියේ පැවතුණු අසම්මත ස්වභාවයත්, ඔහු ලොකය දුටු ආකාරයේ අසම්මත ස්වභාවයත් නිසාම මේ ලිපිය සාමාන්‍ය ශාස්ත්‍රීය ලිපියක පවතින සම්ප්‍රදායන්ගෙන් වෙනස් ආකාරයේ ආකෘතියකට අනුව ලියවී ඇත. මෙම ලිපියෙන් උත්සාහ ගන්නේ වසර 15 කට ආසන්න ප්‍රමාණයක් එස්.බී.ඩී. ද සිල්වා සමඟ විවිධ මාතෘකා සම්බන්ධයෙන් කළ සාකච්ඡාවන් ඇසුරෙන් ඔහුගේ දැක්ම ප්‍රතිනිර්මාණය කිරීම ය. මෙහි දී ඔහු විසින්

ලියන ලද පොත්පත් සහ ලිපි ලේඛණ ද අදාල කරගනු ලැබේ. ඔහුගේ ආර්ථික දර්ශනය, ඔහු අනුගමනය කළ දාර්ශනික විධික්‍රමය, ඔහුගේ ජීවිත පිළිවෙළ, සමහර පුද්ගලයන් හා ප්‍රශ්න සම්බන්ධයෙන් ඔහු උපහාසයෙන් බැලූ ආකාරය මේ ලිපියේ දී විමසුමට ලක් කරනු ලැබේ. ඔහු ජීවත් ව සිටියා නම් ඔහු ගැන මෙසේ ලිවීමට ඉඩ දෙන්නේ නැත. එය ඔහු අකමැති දෙයක් වන නිසා ය. කෙසේ නමුත් ඔහුගේ ශාස්ත්‍රීය-බුද්ධිමය ජීවිතයේ සමහර පැතිකඩවල් මෙන් ම සාමාන්‍ය ජීවිතයේ දී ඔහුගේ ආකල්පයන් සහ ප්‍රතිචාරයන් ගැන ලියා තැබීම වැදගත් යැයි සිතන නිසා මෙම සටහන ලිවීමට පෙළඹුනෙමි.

ආචාර්ය එස්.බී.ඩී. ද සිල්වා 2018.06.15 දින මිය ගියේය. එසේ මිය යන විට ඔහුගේ වයස අවුරුදු 92 කි. ඔහු ගැන දැන සිටියේ ලංකාවේ ඉතාමත් ටික දෙනෙකි. එයට හේතුවක් තිබුණි. ඒ ඔහු ප්‍රසිද්ධියට කැමති කෙනෙක් නොවූ නිසා ය. ලංකාවේ ආර්ථිකය ගැන වඩාත් සංවේදී වූ, ඒ ගැන වැඩියෙන් සිතූ සහ ලියූ පුද්ගලයාගේ අවසන් කටයුතු වලට පැමිණියේ ඉතාමත් ටික දෙනෙක් පමණි.

මා මුලින්ම ඔහුව දුටුවේ 1994 දී ය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ දර්ශන අංශය හා ආර්ථික විද්‍යා අංශය පවතින්නේ එකම ගොඩනැගිල්ලක ය. ආර්ථික විද්‍යා අංශයට සමහර දිනවල දී ඔහු පැමිණෙනවා මා දැක ඇත. නමුත් ඒ කාලයේ දී මා ඔහු කව්දැයි දැන සිටියේ නැත. පසුව, ඔහුගේ විශිෂ්ට කෘතිය වූ *Political Economy of Underdevelopment* ගැනත් ඔහු මහනුවර කුණ්ඩසාල ප්‍රදේශයේ සිටින බවත් දැන ගන්නට ලැබිණි. 2003 දි මුල්වතාවට ඔහුව හමුවීමට අවස්ථාව ලැබිණි.

මුලින්ම ඔහුව මුණගැසීමට ගියේ ඔහුගේ පොත සම්බන්ධයෙන් විවිධ දිශානතීන් ඔස්සේ සාකච්ඡා කිරීමට ය. නමුත් පසුව අපගේ

සබඳතාව දැඩි මානුෂීය, මිත්‍ර සම්බන්ධතාවක් බවට හැරිණි. ඔහුගේ කුණ්ඩසාලයේ නිවසේදීත් මහනුවර සිටි වෘත්තීය සමිති නායකයකු වූ මලියගොඩ මහතාගේ කාර්යාලයේදීත්, බේක් හවුස්, ඩෙවෝන්, රැජින හෝටලය, මහනුවර ICES ආයතනය හා අවසන් වරට ඔහුගේ කලුබෝවිල නිවසේදීත් අපි අඛණ්ඩව හමු වුණෙමු. මුල දී සතියකට වතාවක් හෝ දෙවතාවක් හමුවීම අපි පුරුද්දක් කර ගත්තෙමු.

අපට අවශ්‍ය වූයේ ඔහුගේ පොත ගැන ගැඹුරින් හැදෑරීමට වුවත් ඔහු දැනුම ලබා දුන්නේ අප අපේක්ෂා කළ ආකාරයට නොවේ. 1982 දී ඔහුගේ පොත ප්‍රකාශනයට පත්ව තිබුණු අතර ඔහු ඉන් පසුව කඩදාසි පිටු දහස් ගණනාවක් ලීවේය. ඔහු බොහෝ විට කළේ තමන් ලංකාවේ ඌණ සංවර්ධනය ගැන ගොඩ නැගූ න්‍යායන් අභියෝගයට ලක්වනවාදැයි පරීක්ෂා කිරීම ය. අනෙක් අතට ඔහු ලියූ දේවල් ගැනත් ඔහු පූර්ණ තෘප්තිමත්භාවයට පත්නොවුණු නිසා නැවත නැවත ඒවා සංස්කරණය කළේ ය. අපත් ඇතුළුව බොහෝ දෙනෙක් ඔහු මුණ ගැසීමට ගියේ ඔහුව සම්මුඛ පරීක්ෂණයට ලක්කිරීමට වුවත් ඔහු කළේ එහි අනෙක් පැත්ත ය; අපගෙන් ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් යම් යම් ප්‍රශ්න ඇසීම ය; යම් යම් ක්ෂේත්‍ර ගැන තොරතුරු අපෙන් විමසීම යඃ ඔහුගේ මනස තුළ හැම විටම නිශ්චිත සමස්ත අදහසක් පැවතුණ අතර අපගෙන් යම් යම් සුවිශේෂ කාරණයන් පිලිබඳ තොරතුරු විමසමින් ඔහුගේ සමස්තය සම්පූර්ණ කර ගැනීම සිදු කිරීම ය. කඩයකින් ලැබුණු බිලක්, බෙහෙත් ඖෂධ පෙට්ටියත්, පුවත්වතක පිටුවක් මේ ඕනෑම දෙයක් ඔහුගේ ආර්ථික දාර්ශනික සමස්තය යළි යළිත් තහවුරු කර ගැනීමට අවශ්‍ය මහගු අමුද්‍රව්‍යයන් ය.

ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ මෙන් ම සොබාවික විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණයන් කරන්නේ හුදෙක් උපාධි

ලබා ගැනීමට හෝ සිය තනතුරු උසස් කර ගැනීමේ අරමුණෙන් ය. එවන් උපාධි ලබා ගැනීමෙන් පසුව සහ එම තනතුරු තමන්ට පිරිනැමුණු පසු ඔවුහු නැවතත් පර්යේෂණ නොකරති. පර්යේෂණ කිරීම තමන්ගේ ආත්මීය ජීවිතයේ ම කොටසක් කර ගැනීම, දැනුම නම් ක්ෂේත්‍රයට අලුත් එකතුවක් කිරීම සහ යම් සමාජයක් ආර්ථිකමය, සංස්කෘතිමය, දාර්ශනික වශයෙන් පවත්නා තත්ත්වයෙන් උඩට ගැනීම සඳහා පර්යේෂණයන් කරන අය අතිශයින්ම විරල ය. ලංකාව පවත්නා තත්ත්වයෙන් ඉදිරියට ගැනීම සඳහා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ සිටි පර්යේෂකයන් කිහිපදෙනා අතර එස්.බී.ඩී. ද සිල්වා ප්‍රමුඛයෙකි. මේ ලක්ෂණය පැවතුණු තවත් දෙදෙනෙකු වූයේ නිව්ටන් ගුණසිංහ සහ පී.වී.එස්. ද සිල්වා ය. එස්.බී.ඩී. ද සිල්වාගේ ශාස්ත්‍රීය පර්යේෂණයන් තුළ විශාල සමාජීය අදාලත්වයක් ඇත. මෙම සමාජීය අදාළත්වයේ එක් පැත්තක් වන්නේ සමාජීය විද්‍යාවේ විධික්‍රමය සම්බන්ධයෙන් ඔහු දැක් වූ වෙනස් ආකල්පය ය. ඔහු සමාජ නිරීක්ෂකයෙකුගේ සහ සමීක්ෂකයෙකුගේ භූමිකාවෙන් ඔබ්බට ගොස් න්‍යායික විශ්ලේෂනයක් හරහා සමාජය දෙස බැලීමට උත්සාහ ගත්තේ ය. ඔහු සංඛ්‍යා දත්ත විශ්ලේෂකයකුසේ මට්ටමට නොවැටී සමස්තය සහ සබඳතාවන් අර්ථකථනය කරන්නෙකු විය. ලංකාව මේ ආකාරයේ ඌන සංවර්ධිත රටක් බවට පත් වී තිබෙන්නේ ඇයි ද යන්නත් එයින් ගැලවීම සඳහා අපි අනුගමනය කළ යුතු නිෂ්පාදන ආර්ථික ක්‍රමවේදය කුමක් ද යන්නත් පිළිබඳ ව පර්යේෂණ කිරීම මෙන් ම මෙහි දී පවත්නා දැනුමේ පවතින සීමා පෙන්වා දෙමින් ඒවා විවේචනය කිරීමත් සමාජීය වශයෙන් ඉතාමත් වැදගත් ය. ඔහු සිය *Political Economy of Underdevelopement* කෘතියේ ප්‍රස්ථාවනාව ආරම්භ කරන්නේ මෙවැන්නකිනි.

> Research in the social sciences in underdeveloped countries has, of late, metamorphosed into a variety of big business.

> Institutes and research agencies flourish in rich profusion, with virtually a business interest in staging seminars, symposia and workshops and in sponsoring publications. In contrast, concerned activity committed to exposing the real roots of social disarray is, remaikably, absent (S.D.B. de Silva. 1982. vii).

ඌණ සංවර්ධිත රටවල සමාජ විද්‍යාවන්හි පර්යේෂණ පසුකාලීනව මහා පරිමාණ ව්‍යාපාර බවට රූපාන්තරණය වී ඇත. පර්යේෂණ ආයතන ව්‍යාපාර උනන්දුවකින් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වන අතර මුද්‍රණ කටයුතු සඳහා අනුග්‍රහය දක්වමින් සිටියි. ඊට හාත්පසින් වෙනස් ව සමාජ ව්‍යාකූලත්වයේ සැබෑ මූලයන් හෙළිදරව් කිරීමට කැප වී සිටින ක්‍රියාකාරකම් නැති තරම් ය.

මෙයින් පෙනී යන්නේ එස්.බි.ඩී. ද සිල්වා අනෙක් අයගේ පර්යේෂණවලින් තමන්ගේ පර්යේෂණ වෙනස් වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ඇඟවුමක් කරන බව ය.

**එස්.බි.ඩි. ගේ ආර්ථික දර්ශනය**

ඔහු ප්‍රධාන වශයෙන් උද්‍යෝගිමත් වූයේ එක් ප්‍රශ්නයක් සමඟ ය. ඒ ආර්ථික සංවර්ධනය ය; විශේෂයෙන්ම ලංකාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නය ය. ලංකාවේ ආර්ථික සංවර්ධනය අත්පත් කර ගත හැක්කේ කෙසේද යන්න ඔහු විමසුවේ ය. අප ලංකාවේ සංවර්ධිත යැයි සිතා සිටින ක්ෂේත්‍ර ගණනාවක් ඌණ සංවර්ධිත යැයි ඔහුගේ නිගමනය විය. ලංකාවට විදේශ විනිමය ලැබුණත් එයින් සංවර්ධනය අත්පත් වන්නේ නැත. මුළු ලංකාවම තේ වත්තක් වුවා යැයි සිතමු; ලංකාවම සංචාරක පුරවරයක් යැයි සිතමු; මුළු ලංකාවේම

ගැහැණු මැදපෙරදිග ගෘහ සේවයට යැව්වා යැයි සිතමු; මුළු ලංකාවම ගොවිබිමක් බවට පත් වුවා යැයි සිතමු. මේවායින් ලංකාවට විදේශ විනිමය ලැබීමට පුළුවන. නමුත් මේ එකදු ආර්ථික කටයුත්තක් ආර්ථික සංවර්ධනයට අඳාළ නැත. එස්.බී.ඩී. ගේ හැදෑරීම්වලට අනුව කාර්මික භාණ්ඩ නිෂ්පාදනය තුළින් පමණය ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගත හැක්කේ. මැදපෙරදිග වැඩ කරන කාන්තාවන් ය ලංකාවට වැඩිම ප්‍රමාණයක් විදේශ මුදල් ගෙන එන්නේ. වැඩි වැඩියෙන් විදේශ මුදල් අවශ්‍ය නම් කළ යුත්තේ මේ කටයුත්ත ප්‍රවර්ධනය කිරීම ය. අධ්‍යාපනයට මුදල් වැඩි කිරීමේ අවශ්‍යතාවක් නැත. මක්නිසාද මැදපෙරදිග වැඩ කිරීමට ලොකු අධ්‍යාපනයක් අවශ්‍ය නැති නිසා ය. මැදපෙරදිග මුදල් රටට පැමිණුනත් එයින් ලංකාවේ ආර්ථික සංවර්ධනයක් වෙන්නේ නැත. මැදපෙරදිග මෙන් ඛනිජ තෙල් ලංකාවේ හමුවුනත් ආර්ථිකයේ සංවර්ධනයක් සිදුවන්නේ නැත. එයට හේතුව නම් මේ මුදල් අප යොදවන්නේ පිටරට නිපදවන කාර්මික භාණ්ඩ මිලදී ගැනීමට විනා කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කිරීමට නොවන නිසා ය. මේ කාන්තාවන් නිරත වී සිටින්නේ ඵලදායි නොවන ආර්ථික කටයුත්තක ය. කාර්මික වශයෙන් වඩාත් දියුණු රටවල ආර්ථික වර්ධනය දුප්පත් රටවල ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා මෙහෙය වෙන්නේ නැත. එමෙන් ම දියුණු රටවල ආර්ථික ක්‍රියාකාරකම් දුප්පත් රටවල් තුළ ප්‍රශ්න ගණනාවක් බිහිකිරීමට ද බලපා ඇත. දුප්පත් රටවල දුප්පත්කම මේ ආකාරයෙන් පැවැත්මට හේතුවක් වී තිබෙන්නේ මෙම දුප්පත් රටවල් ප්‍රාථමික භාණ්ඩ පොහොසත් රටවලට අපනයනය කිරීමට සීමා වී තිබීමත් මේ ප්‍රාථමික භාණ්ඩ අනුසාරයෙන් පොහොසත් රටවල් පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් ඒවා පෙරලා දුප්පත් රටවලටම විකිණීමත් ය. මාක්ස්වාදී න්‍යායකරුවන් වූ අන්ඩ්‍රේ ගුන්ඩර් ෆ්‍රැන්ක්, පෝල් ඒ. බැරන්, සහ පෝල් ස්විසි යන අය කීවේ දුගීභාවයේ පැවැත්ම ධනවාදයේ ම

ප්‍රතිඵලයක් බව ය. ලංකාවේ කාන්තාවන්ගේ ශ්‍රමය ප්‍රාථමික භාණ්ඩයක් වශයෙන් විකිණීම මගින් මේ රට තුළ ආර්ථික වර්ධනයක් සිදුවන්නේ නැත.ලංකාවේ බොහෝ දෙනෙක් සංචාරක ව්‍යාපාරයෙන් අපගේ ආර්ථිකයේ වර්ධනයට ලොකු පිටුවහලක් ලැබෙන බවට තර්ක කරන විට එස්.බී.ඩී. මෙය සූක්ෂම ආකාරයට ප්‍රශ්න කළේ ය. යම් හෝටලයක් සංචාරකයන්ගෙන් මුදල් උපයන්නේ ඔවුන්ට කෑම බීම දීමෙන් නොවේ. මේ හෝටලය ඇත්තවශයෙන් ම විකුණන්නේ පරිසරය ය. ඔවුන් හෝටලයක් ඉදිකිරීමේ දී ලස්සන මුහුදු වෙරළක්, කන්දක්, දිය ඇල්ලක් සළකා බලන අතර මේවා කේන්ද්‍ර කරගෙන ය සංචාරකයන් ආකර්ෂණය වෙන්නේ. මෙම සංචාරක ව්‍යාපාරය වටා ලොකු කාර්මික ලෝකයක් බිහිවන්නේ නැත. ලංකාවේ පරිසරය විශාල වශයෙන් විනාශ වෙන අතර මේ තත්වයන් තුළ සංචාරකයන් ලංකාවට පැමිණීම ක්‍රමානුකූලව අඩුවීමට පුළුවන. සංචාරකයන්ට ප්‍රවාහනය සඳහා වාහන සැපයීමෙන්, මඟ පෙන්වීම් කිරීමෙන් ඔවුන්ගේ මුදල් ප්‍රමාණයත් ලාංකිකයන්ගේ සාක්කුවලට පැමිණිය හැකි ය. නමුත් මෙය ආර්ථික සංවර්ධනයට අඳාළ කටයුත්තක් නොවේ.

අපට විදේශ විනිමය ලැබෙන තවත් කර්මාන්තයක් වන්නේ ඇඟළුම් ක්ෂේත්‍රය ය. මේ සම්බන්ධයෙන්ද එස්.බී.ඩී. ට දේශපාලන ආර්ථික විවේචනයක් තිබිණි. මේ ඇඟළුම් කර්මාන්තයට අවශ්‍යය සියළුම දේවල් ගෙන එන්නේ පිටින් ය. රෙදි, නූල්, යන්ත්‍රෝපකරණ, බොත්තම් සියල්ල එන්නේ පිටරටවල් වලින් ය. මේ රටේදී එකතු කරන්නේ ශ්‍රමය පමණි. ශ්‍රමිකයන්ට පඩියක් ලැබෙන නමුත් ඔවුන් පරිභෝජනය කරන භාණ්ඩ වලින් විශාල ප්‍රමාණයක් ගෙන එන්නේ පිටින් ය. ඇඟළුම් කර්මාන්තය වටා ගොඩනැගෙන වෙනත් කාර්මික භාණ්ඩ ක්ෂේත්‍රයක් ලංකාවේ නැත. අපි කාර්මික ආකාරයට රෙදි නූල් නිෂ්පාදනය කරන්නේද නැත.

වී වගාවට සාපේක්ෂව තේ වගාව අර්ථකථනය වූයේ සංවර්ධිත ක්ෂේත්‍රයක් ලෙසට ය. කෙසේ නමුත් එස්.බී.ඩී. තර්ක කළේ තේ කර්මාන්තයත් ඌන සංවර්ධිත බවට ය. තවමත් ලංකාවේ තේ දළු නෙලන්නේ ඉංග්‍රීසීන් තේ වගාව ආරම්භ කල කාලයේ දී මෙන් ය. ලංකාවේ වතු කම්කරුවන් ගණනාවක් නිය පොත්තෙන් තේ දළු කඩන නමුත් සමහර දියුණු රටවල එක් කම්කරුවෙක් දියුණු කාර්මික උපකරණ භාවිත කර මුළු යායකම තේ දළු නෙලයි. මෙහිදී තේ කර්මාන්තය කාර්මිකකරණයට යටත් කර ඇත. තේ වතු වල වැඩ කරන කම්කරුවන්ට මුළු වර්ෂයේදී ම වැඩ ලැබෙන්නේ නැත. නමුත් කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් ගත්තොත් වර්ෂය පුරා ශ්‍රමිකයන්ට වැඩ කිරීමට සිදු වේ.

ඔහු ලංකාවේ වී ගොවිතැනට යොමු වෙමින් පවසා සිටියේ එය ඉතාමත් පැහැදිලිව ඌන සංවර්ධිත එකක් බවය. සාපේක්ෂ වශයෙන් වී ගොවිතැන කාර්මිකකරණය වී තිබෙන්නේ අම්පාර ප්‍රදේශයේ පමණි. එහි කුඩා කුඹුරු වෙනුවට ධනවත් වී මෝල් හිමියන් විසින් අත්පත් කරගත් කුඹුරු යායවල් ඇත. අස්වනු නෙලීම ආදියට යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරයි. වෙනක් ප්‍රදේශවල සිදුවන්නේ පවුලේ ශ්‍රමය පාවිච්චි කරමින් කරන වී ගොවිතැනකි. මේ ගොවියන්ට විශාල අතිරික්ත ශ්‍රමයක් නඩත්තු කිරීමට සිදු වී ඇත. ගොවියන් ළඟ ඉන්නේ ශ්‍රමිකයන් (Labourers) නොව සහයකයන් ය (helpers). මේ සහායකයින්ව වැඩ නැති කාලයේදිත් නඩත්තු කරන්නට සිදුවෙන්නේ ගොවියාටම ය. වැඩ නැති කාලයට ගොවියාගේ බත් මුට්ටිය මේ අයට විවෘත කරන්න සිදුවේ. කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් ගත්තොත් එහි සහයකයන් නැත. ග්‍රාමීය අංශයේ පවතින විරැකියාමය තත්ත්වය එස්.බී.ඩී. නම් කළේ‘ disguised unemployment’ කියාය. මෙහි තේරුම

වන්නේ 'සැඟවුණු රැකියා විරහිතභාවයක්' හෝ 'වෙස්වලාගත් රැකියා විරහිත භාවයක් 'යන්න ය. එය එක් අයකුට කරන්න පුළුවන් දේ වැඩි දෙනෙක් කිරීමේ කටයුත්තකි. වී ගොවිතැනේදී මේ සහයකයන් හැම විටකම අවශ්‍යය නැත. නමුත් ඔවුන්ව නඩත්තු කිරීමට සිදුවේ. ඔහු තර්ක කළ ආකාරයට ග්‍රාමීය ප්‍රදේශවල වැඩ නැති කාලය එකතු කල විට 30% ක පමණ අතිරික්තයකි. මෙම ඌන රැකියාමයභාවය (underemployment) රැකියා විරහිතභාවයක් (unemployment) දක්වා තල්ලු කළ යුතු බව එස්.බී.ඩී. ගේ තර්කය විය. එංගලන්තයේ කොටු කිරීම් ව්‍යාපෘතිවල දී මෙවැන්නක් සිදු විය.

ගොවියාගේ දිළිඳුභාවය පිළිබඳ ප්‍රශ්නයට ඔහු වඩාත් දියුණු අර්ථ කථනයක් ලබා දුන්නේ ය. ගොවියාගේ දිළිඳුකම තීන්දුවන්නේ කාර්මික ක්ෂේත්‍රයේ නිෂ්පාදිත භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව මතය. ගොවියාට බත් පමණක් තිබුණොත් එයින් එලක් නැත. ගොවියාගේ දරුවන්ට සපත්තු, පැන්සල්, බෑග්, මකන කෑලි අවශ්‍යය. ගොවියාට දිගටම බත් කන්න ලැබෙනවා ද යන කාරණය මත ඔහුගේ දිළිඳුකම තීන්දු නොවේ. ගොවියා නිෂ්පාදනය කරන දේ තමන්ම කෑවොත් එයින් ආර්ථිකයට වන යහපතක් නැත. ගොවි ශ්‍රමය සබුද්ධික කිරීමක් කළ යුතු අතර වී ගොවිතැනේ හිර වී ඇති අතිරික්ත ශ්‍රමය ඒ ක්ෂේත්‍රයෙන් එලවා හැරිය යුතු ය. මේ අතිරික්ත ශ්‍රමය කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා තල්ලු කළ යුතුය. ගොවියාට සහනාධාර දීමෙන්ද ඔහුගේ ප්‍රශ්නය විසඳෙන්නේ නැත. ගොවියා හැකි තරම් මිරිකා අනෙක් ක්ෂේත්‍ර වෙත ඔහුගේ එලදාව ගලායාමට සැලැස්විය යුතු ය. කාර්මික භාණ්ඩ ක්ෂේත්‍රය කඩා වැටුණොත් ගොවියාට ද පැවැත්මක් නැත. ගොවියන් ටික දෙනෙක් කාර්මික වශයෙන් ඉහළට නංවා ඔවුන්ගේ එලදාව අඩු මිලකට කාර්මික ක්ෂේත්‍රයේ නිරතවන්නන්ට යැවීම කළ යුතු ය. ගොවියන් ඕනෑවට වඩා පොහොසත් වීමත් ආර්ථිකයට බරක් වේ. ඔවුන් පොහොසත් වුවොත්

ලංකාවේ නිෂ්පාදනය නොකරන අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනිමට ඔවුන් යොමු වේ. ගොවියා වී නිෂ්පාදනය කළත් ලංකාවේ හාල් මිල ඉහළ ය. ගස්ලබු ගෙඩියක් හෝ අඹ ගෙඩියක් මිලදී ගැනීමට පිටරටින් එන ඇපල් ගෙඩියක් දොඩම් ගෙඩියක් ගැනීමට වඩා වියදමක් දැරීමට සිදුවී ඇත. මෙසේ සිදුවන්නේ ඇයි?

ලංකාවේ සාපේක්ෂව මුලික ආහාර ද්‍රව්‍යවල මිල ඉහල ගොස් ඇත. අද ඔරලෝසුවක මිල හා හාල් කිලෝවක මිල සම වී ඇත. කාර්මික භාණ්ඩ පිටරටින් අඩු මිලට ගැනීමට හැකි වෙද්දි අපගේ දේශීය ආහාර මිල ඉහළ ගොස් ඇත. මෙයට හේතුව වන්නේ ලංකාවේ ශ්‍රම අතිරික්තයක් තිබුණත් ශ්‍රමයේ මිල ඉහළ යාම ය. ශ්‍රමයේ මිල ඉහළ යාම ඍජුවම නිෂ්පාදනයට නිෂේධනාත්මක ආකාරයට බලපා ඇත. ශ්‍රමයේ මිල ඉහළ නිසා අපට වියට්නාමයේ, ඉන්දියාවේ පමණක් නොව බංගලාදේශයේ භාණ්ඩ නිෂ්පාදනය සමඟ තරඟ කළ නොහැකි තත්ත්වයක් උදා වී ඇත. තිබෙන නිෂ්පාදනත් ඒ රටවලට ඇදී යාම සිදු වේ.

කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී තවත් අමතර කාර්මික භාන්ඩ සිය ගණනක් නිෂ්පාදනය කිරීමට සිදු වේ. කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් සොබාදහමේ බලපෑම් වලින් සාපේක්ෂව මිදී ඇත. වී ගොවිතැන මෙන්ම ධීවර කර්මාන්තයත් සොබාදහමේ බලවේග අනුව නිෂ්පාදනය ඉහළ පහළ යාම් සිදු වේ. කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කිරීම දාම ප්‍රතික්‍රියාවක් ජනිත කරයි. ඒ තුළ පුපුරණ සුළු ස්වභාවයක් ඇත. නමුත් ලංකාවේ අල්පෙනෙත්තක්වත් නිෂ්පාදනය කරන්නේ නැත.

ලංකාවේ අධිවේගී මාර්ග ඉදිවෙන විට බොහෝ දෙනෙක් තර්ක කළේ මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට අතිශයින්ම උපකාර වන්නක් බවට ය. නමුත් අප සමඟ කතා බහේ දී එස්.බී.ඩී. මෙවැන්නක්

ප්‍රකාශ කළේ  ය. මේ පාරවල් දිගේ දකුණේ ඇති කර්මාන්තශාලා වලින් නිපදවන භාණ්ඩ පුරවාගත් ලොරි කීයක් මාර්ග තදබදයකින් තොරව කොළඹට පැමිණේ ද? මේ ලොරිවල ගෙනෙන කාර්මික භාණ්ඩ පිටරටවලට අපනයනය කෙරේ ද? එසේ නොමැති නම් සුඛෝපභෝගී හා අධි සුඛෝපභෝගී  වාහන වල නැග ගත් අය කලින් පැය  පහකින් ගමන නිම  කලා නම් දැන් පැය දෙකකින් ඒ ගමන නිම  කර ඉතිරි  කර ගත් පැය තුන ඵලදායි කාර්යයක නිරතවේ ද? අධිවේගී මාර්ගවල මිනිස්සු යන්නේ වැඩකට ඇති ගමන් ද? වැඩකට නැති ගමන් ද?

එස්.බී.ඩී. සමඟ මා නුවර සිට කටුගස්තොට ප්‍රදේශයට යන විට පාර දෙපස ඇති වාහන අලෙවි සැල්  දෙස බලා මෙවැන්නක් පැවසී ය:

> මේ අයට තම ව්‍යාපාර කටයුතු කරන්න පර්චස් 10-15 ක ප්‍රමාණයක් ඇති. ලංකාවේ  දී කාර් එකක් නොව අමතර කොටසක්වත් නිෂ්පාදනය කරන්නේ නැත. නමුත් වාහන සේල් නම් බිහි වී ඇත. ඉන්දියාව කාර් හදන විට අපි කාර් විකුණනවා. අපට තියෙන්නේ වෙළඳ හා මූල්‍ය ප්‍රාග්ධනයක් පමණය. නිෂ්පාදන ප්‍රාග්ධනයක් නැත. ගෝලීයකරණය සිදුවන්නේ එක් දිශාවකට පමණයි. ගෝලීයකරණය යටතේ චීනයේ බඩු මෙරටට පැමිණුනද මෙහි භාණ්ඩ චීනයට යන්නේ නැත. ලංකාවේ ධනපතියෝ දියුණු වන්නේ  නිෂ්පාදනය හරහා නොවේ. වෙළඳපල හරහායි. මේ ධනපතියෝ වැඩ කරනවා වුවත් වැඩකට නැති වැඩයි කරන්නේ.

ඔහු තර්ක කරන ආකාරයට ආර්ථික සංවර්ධනය ගැන අපි සිතිය යුත්තේ යුද්ධයක් ලෙසට  ය. අපි දිනනවාද පරදිනවාද යන්න මෙහි දී තීන්දු වේ. යුද්ධයේදී වෙනත් අංශවලින් ගන්නා අතිරික්තය හමුදාව සඳහා යොදවයි. අනෙක් අංශ පාලනය කර යුද්ධයට ප්‍රමුඛත්වය ලබාදෙයි. මේ සඳහා

ඉඩම් පවරා ගන්නා අතර යුද්ධය කරන්නේ රජය ය. යුද්ධ කරන්නේ පෞද්ගලික අංශය නොවේ. අප වැනි රටකට ජාත්‍යන්තර වෙළඳපලේ භාණ්ඩවල මිල සම්බන්ධයෙන් බලපෑමක් කළ නොහැකි ය. නමුත් එම භාණ්ඩවල දේශීය මිල සම්බන්ධයෙන් බලපෑමක් කළ හැකි ය. පිටරටින් ගෙනෙන සමහර භාණ්ඩ පාලනය කර හෝ ගෙනෙන භාණ්ඩ වලින් බදු අය කර හෝ එම භාණ්ඩවල ජාත්‍යන්තර අගයට වඩා වැඩි මිලකට විකුණා හෝ යම් ලාභයක් ගෙන සමහර අත්‍යවශ්‍ය භාණ්ඩ වලට සහනාධාර දිය හැකි ය. මෙය කළ හැක්කේ රජයට පමණය. ලංකාවේ පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්ට ලෝක වෙළඳපල සමග තරග කළ නොහැකි ය. මේ නිසා ඔවුන් නිෂ්පාදන ප්‍රාග්ධනය වෙනුවට යොමු වෙන්නේ මූල්‍ය ප්‍රාග්ධනය වෙත ය. ඉඩම් කැබලි කර විකිණීම, රක්ෂණ සමාගම්, පෞද්ගලික බැංකු, වාහන සේල් මෙයට උදාහරණයන් ය.

සමහර භාණ්ඩ ලංකාවේ නිෂ්පාදනය කරනවාට වඩා පිටරටින් ගෙන්වීම වඩා වාසිදායක යැයි තර්කයක් ඉදිරිපත් වෙන විට එස්.බී.ඩී. ලබා දුන් පිළිතුර මෙවැන්නකි. ඉන්දියාව, බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් ව පැවති සමයේ ඉන්දියාව තුල පැතිරුණ රෙදි කර්මාන්ත ක්ෂේත්‍රයක් තිබිණි. ඉන්දියාව රෙදි ලබා ගැනීම බ්‍රිතාන්‍යයට වාසිදායක වුවත් බ්‍රිතාන්‍ය එසේ කළේ නැත. ඉන්දියාව රෙදි කර්මාන්තයට ඉඩ දුන්නේත් නැත. බ්‍රිතාන්‍යය පරිවර්තනය වූයේ නිෂ්පාදනය හරහා ය. ඔවුන් තම නිෂ්පාදනය අඩාල කරගත්තේ නැත. ඔවුන්ට දිගටම අවශ්‍ය වූයේ ඉන්දියාවෙන් අමුද්‍රව්‍ය ලබා ගෙන තම රට තුළ නිෂ්පාදනය කටයුතු කිරීමට ය. බ්‍රිතාන්‍යයට අවශ්‍ය වූ දෙයය අප තවමත් කරමින් සිටින්නේ. ඒ කෘෂි කර්මාන්තය කාර්මික නොකර දිගටම තබා ගැනීමත්, නිෂ්පාදන කටයුතු නොකර අමුද්‍රව්‍ය අපනයනය කිරිමත් ය. ග්‍රාමීය අංශය ක්‍රමානුකූලව විනාශ කළ යුතු අතර නගර දියුණු කල යුතු ය. නමුත් ඒවා කාර්මික නගර කළ යුතු ය. මේ නගර තිබෙන්නේ සුබෝපභෝගී ජීවිත

ගත කිරීමට නොවේ. හොඳම පාසල්, හොඳම රෝහල්, සුපිරි වෙළඳසැල්, සමාජ ශාලා සහිත කොළඹ නගරය යනු සුඛෝපභෝගී ජීවිත ගත කිරීමට ඇති අවකාශයකි. මෙවන් නගර පරපුටු නගරයන් ය (parasite cities). මේවා වනාහි ග්‍රාමීය අංශයේ නිපදවන දේ උරාගන්නා තැන් ය. සුනාමියෙන් සිදු වූ විනාශයට අවධානය යොමු කරමින් එස්.බී.ඩී. වරෙක මෙසේ කිවේ යඃ

> සුනාමියෙන් බෝට්ටු විනාශ වූවොත් යම් දුරකට එය ආර්ථිකයට බලපෑමක් කළ හැකියි. නමුත් කොළඹ නගරය සම්පූර්ණයෙන් විනාශ වූවොත් එය ආර්ථිකයට යහපතක් වෙයි. සුඛෝපභෝගි වාහන, නිවාස, විනෝද ස්ථාන විනාශ වුවාට ආර්ථිකයට බලපෑමක් වෙන්නේ නැත. මේ රටේ ඇති යටිතල පහසුකම්, මහාමාර්ග, විනෝදය සඳහා මිස ආර්ථික සංවර්ධනය සඳහා නොවේ. නමුත් රටේ වැඩියෙන්ම දියුණු වන්නේ මේ වැඩකට නැති අංශයන්ය. මේ රටේ සාධාරණ ආර්ථිකයට යටින් පාතාල ආර්ථිකයක් ක්‍රියාත්මක වනවා නොව සමස්ත ආර්ථිකයම පාතාල ආර්ථිකයකි.

යම් රටක දිගින් දිගටම උද්ධමනය පැවතුණොත් කාර්මික නිෂ්පාදන කටයුතු කළ නොහැකි අතර රැකියා නිෂ්පාදනයක්ද සිදුවන්නේ නැත. පඩි වැඩි කිරීමෙන් ආර්ථිකය තව තවත් ආගාධයට ඇද වැටේ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අධ්‍යාපනය සඳහා ජාතික ආදායමෙන් 6% ක් වෙන් කිරීම හා පඩි වැඩි කිරීම සඳහා අරගලයක නිරතවෙමින් සිටි දවස් වල ඔහු සමඟ පැවති කතාබහකදී මෙවැන්නක් ප්‍රකාශ කළේ ය.

> රුපියල් පනස්දාහක් ගන්නා කෙනාගේ වැටුප රුපියල් ලක්ෂය දක්වා වැඩි කිරීමෙන් පසු ඔවුන්ගේ ශාස්ත්‍රීය ඵලදාවත් ඒ සමානව ඉහළ යනවා ද? මේ අයත් ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ

නිෂ්පාදන කටයුත්තක් නෙමේ කරමින් සිටින්නේ. වැටුප් වැඩි කරනවා වෙනුවට කළ යුත්තේ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ස්ථාවර මට්ටමක තබා ගැනීම ය.

මේ රටේ මිනිසුන් සල්ලි සොයන්නේ නිෂ්පාදන කටයුතු වලින් නොව උද්ධමනයෙන් බව ඔහුගේ අදහස ය. මහාමාර්ගයක් අයිනේ ඉඩමක් අරගෙන ලොකු නින්දකට වැටී අවදි වූවාට පසු ඒ ඉඩමේ මිල උද්ධමනයට පිං සිදුවෙන්නට වැඩි වී ඇත. එයින් ඔහුට පෝසතකු විය හැකි ය. කිසිදු නිෂ්පාදන කටයුත්තක් නොකර ඉඩම් හා රත්රන් අත්පත් කර ගැනීමෙන් යමෙකුට පොහොසත් විය හැකි ය.

ලංකාවේ බොහෝ වාමාංශිකයන් ලංකාවෙ ආර්ථික ක්‍රමය තුළ මිනිසුන් දුප්පතුන් වීම හා ඔවුන්ට උදවී තිබෙන දුක්බර ජීවන තත්ත්වය ගැන සංවේදී වන විට එස්.බී.ඩී. වෙනත් ආකාරයේ දේශපාලන ආර්ථික ප්‍රශ්නයක් ඇසුවේ ය. යම් සුපිරි වෙළඳසලක් ඉදිරියේ ලොතරැයි විකුණා අමාරුවෙන් ජීවිතය ගැට ගසා ගන්නා මිනිසෙකු ගැන සෙවීමට වඩා වැදගත් වන්නේ මේ සුපිරි වෙළඳසල ඇතුලේ විශාල ට්‍රොලියකට බඩු පටවා ගත් නොනා කෙනෙකුට මීටරයක් පමන දිග බිලක් ගෙවීමට හැකිවුණේ කොහොම ද යන කාරණය ය. මෙතරම් ආර්ථික අර්බුදයක් ඇති රටක යම් පිරිසක් ඉතාමත් සුපිරි වාහන පාවිච්චි කරන්නේ කෙසේ ද? ඒවාට ඉන්ධන ගසන්නේ කෙසේ ද? රටේ බොහෝ දෙනෙක් මන්ත්‍රීවරු හා ඇමතිවරු සුපිරි වාහන පාවිච්චි කිරීම ගැන විවේචනාත්මක වන විට එස්.බී.ඩී. කියා සිටියේ මෙය නොගිනිය හැකි තරම් සංඛ්‍යාවක් බවත් ඒ ආකාරයේ වාහන නිවාස සමගින් සුඛෝපභෝගී ජීවිත ගෙවන පන්තියක්ම මේ රටේ සිටින බව ය. මේ අය සල්ලි හොයා ගත්තේ කෙසේ ද?

මේ රටේ වැඩිම වියදමක් දරන්නේ තුන්වේල බත් කන අයව නඩත්තු කිරීමට නොව මහාමාර්ග, උසස් පරිභෝජනය හා සුපිරි වාහන සඳහා ය. මේ පන්තියේ අයට අවශ්‍ය දේ සඳහා රටේ මුදල් වියදම් කර රටේ අවශේෂ මිනිසුන්ට අත්‍යවශ්‍ය දේ මිලදී ගැනීම සඳහා ණය ගැනීමය සිදුකරන්නේ. මෙය යම් කෙනෙකුගේ වැටුප තැබෑරුමකට දී ගෙදර අයගේ කෑම සඳහා ණය ගන්නවා වැනි වැඩකි. ලංකාවේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් සිටින්නේ වෙළඳපලට පිටිනි. ඔවුන්ට වෙළඳපලට සම්බන්ධ වීමට තරම් වත්කමක් නැත. ගෑස්, කිරිපිටි පාවිච්චි නොකරන, ආණ්ඩුවේ ඉස්පිරිතාලයෙන් බෙහෙත් ගන්නා මේ අයට ආර්ථිකයට මොනවා වුවත් අදාළත්වයක් නැත. ධනපතීන්ට වෙළඳපලේ භාණ්ඩ මිල ඉහළ යාම සොච්චමකි. ප්‍රශ්නය ඇඟට දැනෙන්නේ නාගරික මධ්‍යම පන්තියට ය. මෙ අයත් නිෂ්පාදන කටයුත්තක් නොකරන අය ය. රටේ සම්පත්වලින් වැඩිම ප්‍රමාණයක් පාවිච්චි කරන්නේ යම් පන්තියක පෞද්ගලික පාවිච්චිය සඳහා ය. මේ අනුව මේ ක්‍රමය නඩත්තු කිරීමට ය විශාල නාස්තියක් සිදුකරන්නේ. ලංකාව තුළ රැකියාවක් නැති කෙනා නඩතතු කරනවාට වඩා රැකියාවක් ඇති කෙනා නඩත්තු කිරීමට විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇත. ඵලදායි නොවන රැකියා නඩත්තු කරනවා වෙනුවට ඔවුන්ට මුදලක් දී ගෙදර තැබීම ආර්ථික වශයෙන් යහපත් ය.

ප්‍රභාකරන්ගේ මරණයෙන් පසුව එස්.බී.ඩී. හමු වූ මෙහොතක එහු කියා සිටියේ, යුද්ධය කොළඹ නගරයේ සුභෝපභෝගී ජීවිත වලට බාධාවක් නොවුණ බව ය. මහ බැංකුවට ප්‍රහාර එල්ල වුණා කියා ආර්ථිකයට බලපෑමක් නොවුණ බව ය; වරායට ගැහුවත් පිටරට නිෂ්පාදිත භාණ්ඩ මේ රටට ගලා ගෙන එන බව ඔහුගේ මතය ය. මේ රටේ පවත්නා ආර්ථිකයට ප්‍රභාකරන් බාධාවක් නොවූ බව ය. වාහන නිෂ්පාදනය කරන්න එපා යැයි ප්‍රභාකරන් පවසා නැත. ප්‍රභාකරන් ලංකා

හමුදාව සමඟ යුධ වැදී සිටි කාලයේ එස්.බී.ඩී. මෙවැන්නක් කීවේ ය. ප්‍රභාකරන් උතුරු නැගෙනහිර වෙන් කරගත්තොත් අවශ්‍ය නම් ඔහුට පාලන ආර්ථිකයක් අත්කර ගැනීමේ ඉඩක් තිබේ. නමුත් ලංකා හමුදාව දිනුවොත් දකුණේ තහවුරු වී තිබෙන නිෂ්පාදනීය නොවන වෙළඳ ආර්ථිකයම උතුරේත් තහවුරු වෙනවා ඇත. ඇත්තටම දැන් සිදුවෙමින් තිබෙන්නේ මෙහි දෙවැන්න ය.

යුද්ධය ක්‍රියාත්මක වන කාලයේ ආණ්ඩුව කියා සිටියේ යුද්ධයට යන වියදම පියවා ගැනීමට ආණ්ඩුවට ජනතාවගෙන් බදු ගැනිමට සිදුවී තිබෙන බව ය. නමුත් එස්.බී.ඩී. කියන ආකාරයට මෙහි දී ඇත්ත වශයෙන්ම සිදුවූයේ රජයට අත්පත් විය යුතු මුදල් ධනපතින්ගේ සුඛ විහරනය සඳහා වියදම් කර ඉතිරි ටික මිනිසුන්ගෙන් බදු වශයෙන් ගැනීමය. ජනතාවට බදු ගසන්නේ ආණ්ඩුවට මුදල් නැති නිසා නොවේ. එක් පන්තියක් වෙනුවෙන් කරන මුදල් නාස්තිය පියවා ගැනීම සඳහා ජනතාවගෙන් බදු අය කිරීමට සිදු වී ඇත.

එස්.බී.ඩී. පැවසූ අකාරයට ලංකාවේ ආර්ථිකය සෑදීමට මුල් වතාවට සබුද්ධික ආකාරයෙන් කටයුතු කල මොහොත 70-77 කාල පරිච්ඡේදය ය. මේ කාලයේදී හාල් පොලු දැමීම සිදු කෙරුණේ පාලකයන්ට වැඩියෙන් හාල් කෑම සඳහා නොවේ. සමාජයේ තවත් කොටසක් වෙත එම භාණ්ඩ ගලා යාමට සැලැස්වීමට ය. අනෙක් අතට මෙ කාලයේ ජාත්‍යන්තර වශයෙන් ආර්ථික අර්බුද ගණනාවක් පැවති යුගයකි. මේවා රට ඇතුළටත් බලපෑවේ ය. අප කළ යුතුව තිබුණේ කෙසේ හෝ එම උත්සාහය තවදුරටත් අල්ලාගෙන සිටීම ය. එවන් ආකෘතියක් නඩත්තු කල හැක්කේ රාජ්‍ය අංශයට පමණි. මේ සඳහා දේශපාලන තීන්දුවක් ගත යුතුව ඇත. අප හසුවී සිටින ආර්ථික විෂම චක්‍රයෙන් ගැලවීමට පාලන ආර්ථිකයකට යා යුතුව ඇත.

**දාර්ශනික විධික්‍රමය**

එස්.බී.ඩී. දේශපාලන, ආර්ථික විශ්ලේෂකයකු පමණක් නොව ආර්ථික පර්යේෂකයකු ද විය. ඔහු අනෙක් අයගේ විධික්‍රමය ගැන පමණක් නොව තමන්ගේ පර්යේෂණ විධික්‍රමය ගැන ද හොඳ අවබෝධයකින් සිටියේ ය. ඔහු සෑම විටකම සිටියේ නිශ්චිත පර්යේෂණක ය. ඌන සංවර්ධිත රටවල සමාජීය විද්‍යාවන්ගේ පර්යේෂණ විධික්‍රමය වනාහී දත්ත එකතු කිරීම හා ඒවා මිනුමට ලක් කිරීමට වඩා වැඩි දෙයක් නොවන බව ඔහු විසින් 1980 දී කළ දේශනයක් හා ලිපියක් තුළ දක්වා ඇත. මෙහි මාතෘකාව වූයේ 'Theoretical and Empirical Perspectives in Social Sciences' යන්නය. ඔහු එහිදී මෙසේ විවේචනාත්මක වෙයි.

> I carriedout a sample servay of so many households over 03 or 04 months. I employed so many investigators and they processed this information on a computer. I think so and so and these are the tables and this is the report (S.B.D.de Silva 1980, 38).

'මම මාස තුන හතරත් බොහෝ නිවෙස් සම්බන්ධ කර නියැදි සමීක්ෂණයක් කළෙමි. මම බොහෝ විමර්ශකයින් යොදවා ඇති අතර ඔවුන් මෙම තොරතුරු පරිගණක කොට ඇත. මම සිතන්නේ මෙහෙම වන අතර මේ මගේ වගුය; මේ මගේ වාර්තාවන් ය. 'මෙම යථානුභූතවාදයෙන් එස්.බී.ඩී. පැහැදිලිව ගැලවිණි. දත්ත සහ හුදු සංඛ්‍යා ලේඛණ පසුපස හඹායාම ආර්ථික විද්‍යාවේ සාරය බිඳවැටීමක් ලෙසට ඔහු හඳුනා ගත්තේ ය. ඔහු වරෙක උපහාසාත්මක ලෙස පවසා සිටියේ ස්ටාලින්ට අනුව සංඛ්‍යා ලේඛණ වැදගත්වන්නේ මැරුණු මිනිසුන්

ගණන් කිරීමට පමණි. ඔහු තමන්ගේ විධික්‍රමය මෙසේ අර්ථකථනය කරයි:

> The socio-economic process basically is an indissoluble whole composed of the complicated network of human relations and responses whose general character may be disturbed by accidental elements that cannot be isolated. As Marx said, in the analysis of economic forms, neither microscopes nor chemical agents are of use (S.B.D.de Silva 1980, 42).

සමාජ ආර්ථික ක්‍රියාවලිය මූලික වශයෙන් සංකීර්ණ මිනිස් ජාලයකින් සහ ප්‍රතිචාරයන්ගෙන් සමන්විත නොබෙදිය හැකි සමස්තයයකි. මෙහි සාමාන්‍ය චරිත ස්වභාවයට බාධා කළ හැක්කේ අහඹු මූලිකාංගයන්ගෙන් වන අතර ඒවා හුදකලා කළ නොහැකි ය. මාක්ස් පැවසූ පරිදි ආර්ථික ආකෘති විශ්ලේෂණයක දී අන්වීක්ෂ හෝ රසායනික කාරක පාවිච්චි කරන්නේ නැත. ඔහු මාක්ස්ගේ විධික්‍රමය සුවිශේෂයන් තුළ සාමාන්‍යය සොයන්නක් බවත් සාමාන්‍යය තුළ සුවිශේෂය සොයන්නක් බවත් හඳුනා ගිනියි. විද්‍යාත්මක දැනුම දෙන ලද කරුණු වලට ඌනනය කළ නොහැකි ය. කරුණු වනාහි දෙන ලද දේවල් නොව නිෂ්පාදනය කරනු ලබන දේවල් ය; එස්.බී.ඩී. කරුණු හඳුනාගන්නේ විවිධාකාර න්‍යායාත්මක හා දෘෂ්ටිවාදී භාවිතාවන්ගේ නිෂ්පාදනයන් වශයෙන් ය. කරුණු තෝරා බේරා ගැනීම සැකැස්ම හා වර්ග කිරීම සංඛ්‍යානමය කටයුත්තක් නොව දාර්ශනික ප්‍රශ්නයකි. තමන්ගේ විධික්‍රමය පැහැදිලි කිරීමේදී එස්.බී.ඩී. චාල්ස් වුයිට් මිල්ස්ව උපුටා දැක්වීම කරයි.

> One should put back these fragments or bits and pieces into the system to which they belong enabling a social phenomenon to be seen as an organic whole with complementary relations or reciprocities between these different ponts (S.B.D.de Silva 1980, 44).

යමෙක් කොටස් හෝ කෑලි ඒවා අයත් වන පද්ධතියට නැවත සම්බන්ධ කළ යුතු අතර එයින් සමාජ ප්‍රපංචයන් ඓන්ද්‍රීය සමස්තයක් ලෙසට දැකීමට හැකි වේ. විවිධ ලක්ෂණයන් අතර අනුපූරක සබඳතා දැකීමටත් හැකි වේ. ඔහුගේ විධි ක්‍රමයේ ප්‍රමුඛම අංගය වූයේ කේන්ද්‍රීය සමස්තය පිළිබඳ අදහස ය. ලංකාවේ බොහෝමයක් ආර්ථික විශේෂඥයන්ට සමස්තය පිළිබඳ අදහස වැටහුණේ නැත. මේ සමස්තය සහිතව ඔහු පර්යේෂණ කීපයක් සම්බන්ධයෙන් සිත යොමු කර තිබිණි. ඔහුට අම්පාර ප්‍රදේශයට ගොස් ඒ ප්‍රදේශයේ වී ගොවිතැන, වී මෝල් හිමියන්ගේ කාර්යභාරය, ඔවුන් කොතරම් දුරට තාක්ෂණය භාවිත කරනවා ද යන කරුණු සෙවීමට අවශ්‍ය විය. ඔහු ලංකාවේ ධීවර කර්මාන්තය සම්බන්ධයනේ පර්යේෂණයක් කර තිබිණි. මෙම පර්යේෂණ ප්‍රකාශනයට පත් කරන ලෙස මා ඉල්ලා සිටි අවස්ථාවේදී ඔහු පැවසුවේ එහි තවදුරටත් දියුණු කළ යුතු තැන් තිබෙන බවට ය.

ඔහු කලක් කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධව සිටියත් සම සමාජ පක්ෂයේ නායකයකු වූ කොල්වින් ආර් ද සිල්වා සම්බන්ධයෙන් ඉහළ ඇගයීමක් තිබිණ. එක් අවමඟුල් අවස්ථාවක දී තමාට කොල්වින්ව මුණගැසුණු බවත් එහි දී තමාගේ පොත ඔහු ඉතාම ගැඹුරින් හදාරමින් සිටින බව තමාට පැවසූ බවත් එස්.බී.ඩී. මා සමඟ කියා ඇත. ඔහු තව දුරටත් පවසන ආකාරයට කොල්වින්ගේ මතය වී තිබෙන්නේ ලංකාවේ කෘෂිකර්මාන්තය කාර්මීකරණයට යටත් කළ යුතු බවට ය. කොල්වින්

සම්බන්ධයෙන් අප අතර පැවති සාකච්ඡා අතර තුර මා සතුව පැවති *Colvin R de Silva: Selected Speeches and Writings* (2007) කෘතිය මා ඔහුට ලබා දුන් අතර එහි පැවති එක් ලිපියක් වූ 'The class struggle in Sri Lanka and the nationalization of the plantation' ඔහු වඩාත් ගැඹුරින් හඳුරා ඇති බවට සාක්ෂි පැවතිණි. එස්.බී.ඩී. පැවසූ ආකාරයට කොල්වින්ට අනුව ලංකාවේ ධනේශ්වර පන්තියේ තොටිල්ල පොල් කර්මාන්තය ය. අනෙකුත් වගාවන්ට සාපේක්ෂව පොල් කර්මාන්තය කාර්මීකරණයට ලක්වී ඇත. මේ සම්බන්ධයෙන් වැඩි දුර තොරතුරු සෙවීමේ උනන්දුවක් එස්.බී.ඩී. ට තිබුණු අතර වයඹ පළාතේ තැන් කීපයකට ගොස් තොරතුරු සොයමුයි ඔහු මට යෝජනා කළේ ය. කෙසේ නමුත් අප දෙදෙනාටම එකට ගෙස් තොරතුරු සෙවීමට නොහැකි වූ නමුත් මම පමණක් වයඹ පළාතේ පන්නල, මාකඳුර ප්‍රදේශයේ මහයාය වත්තට ගොස් ඔහුට අවශ්‍ය තොරතුරු ප්‍රමාණයක් ලබා දුන්නෙමි.

ලංකාවේ ධනේශ්වර පන්තියේ නැගීම ස්ත්‍රීවාදය, ජාතිකවාදය හා පන්ති අරගලය සම්බන්ධයෙන් වෙනත් අය අතින් කෙරුණු පර්යේෂණයන්ට ද ඔහුගේ සහය ලබා දී ඇත. සමහර පර්යේෂණ අත්පිටපත් සංස්කරණය කර තිබෙන්නේ ඔහු ය. මෙහි දී එස්.බී.ඩී. කරන්නේ එම අත්පිටපත් වල අඩුපාඩු සරලව සංස්කරණය කරනවාට වඩා වැඩි දෙයකි. එහි දී ඔහු මුල් කතුවරයා නොකියවූ මූලාශ්‍රවලට ද යොමු වෙමින් අලුත් කරුණු එකතු කරමින් සංස්කරණ කටයුතු කරයි. ඔහු බොහෝ විට කරන චෝදනාවක් නම් මේ නිබන්ධ තුළ තිබෙන්නේ 'cut and paste' සම්ප්‍රදායක් බවත් සමස්තය පිළිබඳ හැඟීම මගහැරී ගොස් ඇති බවත් ය. අවස්ථා කිපයකදීම පේරාදෙණිය විශ්වවිද්‍යාල

පුස්තකාලයෙන් පොත් පත් ලිපි ලේඛණ ගණනාවක් මේ සංස්කරණ කටයුතු සඳහා මම ගෙනත් දුන්නෙමි.

ලංකාවේ ධනේශ්වර පන්තියේ නැගීම සම්බන්ධයෙන් කෙරුණු එක් පර්යේෂණයක් ගැන එස්.බී.ඩී. මෙවැනි වූ විවේචනයක් ගෙන ආවේය. අරක්කුකරුවන් හා රේන්දකරුවන්ගේ නැගීම හරහා ලංකාව තේරුම්ගත හැකි ද? වාණිජ ධනපතියන් කාර්මික අංශයට ආයෝජනය නොකළේ මන්ද? බ්‍රිතාන්‍යයේ බියර් කර්මාන්තය එහි ආර්ථික සංවර්ධනයට සෑහෙන දුරට බලපෑවේය. මේ සඳහා රසායන විද්‍යාව වර්ධනය කිරීමට සිදු විය. බර්මින්හැම් විශ්වවිද්‍යාලයේ ඊටම අඳාළ පීඨයක් ආරම්භ විය. බෝතල් නිෂ්පාදනය ඇති විය. තැබෑරුම තුළ බියර් වක්කිරීමට අළුත් ක්‍රියාමාර්ගයක් අවශ්‍ය විය. මේ සඳහා විශේෂ වීදුරු වර්ගයක් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය විය. මෙයට හේතුව නම් මිනිසුන් බීවේ 'ඇසෙන්' නිසාය. නමුත් ලංකාවේ අරක්කුවලින් ආර්ථික දියුණුවට කිසිදු බලපෑමක් ඇති වූයේ නැත. රේන්දකාරයන් ධනේශ්වර පන්තියක් ලෙසට සැලකිය නොහැකිය. ධනේශ්වර පන්තිය යනු තැන් තැන් වල සිටි පොහොසත් මිනිසුන් නොවේ. මේ අය පන්තියක් බවට පත් වූයේ නැත. මේ අයට රටේ කාර්මික පෙරළියක් කිරීමට අවශ්‍ය වූයේ නැත. වාණිජ ධනපතියන් කාර්මික ධනපතියන් බවට පත්නොවූයේ ඇයි ද යන්න සෙවීමට වෙනම පර්යේෂණයක් කළ යුතුව ඇත. යම් 'සොක්කෙක්' 'ලොක්කෙක්' බවට පත්වීම මඟින් යම් මිනිස් කොට්ඨාශයක් පන්තියක් බවට පත්වීම ගැන නොකියවෙන බව එස්.බී.ඩී. ඉදිරිපත් කරන තර්කය වේ. 'බුෂුවා' නම් වචනය "පොහොසත් වූ මිනිසුන්" යන්නට යෙදිය නොහැකි බව ඔහුගේ අදහසය. මෙහිදි ඔහු යොමුවන්නේ හොබ්ස්බෝම්ගේ විග්‍රහයන්ට ය.

ඔහු බොහෝමයක් පර්යේෂනයන්ගේ දුර්වලතා පෙන්වීමටත්, එම දුර්වලතාවන් ඉක්මවා යාමටත් අවශ්‍ය දැක්ම ලබාගැනිම සඳහා

කියවූ සහ අපට කියවීමට නිර්දේශ කළ කෘතියක් වූයේ ජෝර්ජ් ලූකාස්ගේ *History and Class Consciousness* ය. ඔහු පැවසූ ආකාරයට තමන්ගේ ජීවිත කාලය තුළ ඔහු කියවූ හොඳම සහ වැදගත්ම කෘතිය මෙය ය. ඔහු ඇගයූ ආකාරයට යථානුභූතවාදින්ගේ කරුණු උඩදැමීමේ කටයුත්තට ලූකාස් තදින් පහර දෙයි. මාක්ස්වාදී දයලෙක්තික විධික්‍රමය යථානුභූතිවාදී ප්‍රවේශයෙන් වෙනස් ය. කරුණු (කොටස්) වලින් සෑදෙන සමස්තය ලූකාස් වැදගත් කොට දක්වයි. යථානුභූතවාදීන්ට කරුණුවල ඇති ඓතිහාසික ගතික ස්වභාවය හසු නොවේ. ලූකාස් ලෝකය දෙස බැලීමේ දී සළකා බලන්නේ මැදිහත්කරණය (mediation) හා සමස්තය (totality) නම් ප්‍රවේශයය. මෙම කෘතිය පැහැදිලිව ම හෙගලියානු එකක් වන අතර ජර්මානු විඥානවාදී අදහස් සාකච්ඡාවට ලක්කර ඇත. එස්.බී.ඩී. පරිශීලනය කළ කෘතිය මට ලබා දුන් අතර ඔහු එය වචනයක් වචනයක් පාසා පුළුල් අධ්‍යයනයට ලක්කර ඇති බව මම නිරීක්ෂණය කළෙමි. පසුව මේ කෘතිය සම්බන්ධයෙන් අප අතර ඇති වූ සාකච්ඡා වලදී මා දන්නා කරුණු ඔහු සමඟ හුවමාරු කරගත්තෙමි. ලූකාස් මෙම කෘතිය ලියන්නේ මාක්ස්ගේ *Economic and Philosophical Manuscript of 1844* කෘතිය කියවීමට පෙර ය. මක් නිසා ද එම කෘතිය ලූකාස් තමන්ගේ පොත ලියන විට (1923) මුද්‍රණය වී තිබුණේ නැත. එමෙන් ම ලූකාස් තම කෘතිය ලියන්නේ ලෙනින්ගේ *Philosophical Notebook* කෘතිය ප්‍රකාශනයට පත්වීමටත් පෙරය. මොස්කව් වල පිහිටා තිබුණ Institiute of Marxism - Leninism ලේඛනාගාරයට ගොස් මේ කෘති දෙකම මුල්වතාවට කියවීමට භාග්‍යය ලැබූ යුරෝපියානු මාක්ස්වාදියා ලූකාස්ය. මේ ආයතනයේ ප්‍රධාන තැන දැරූ ඩේවිඩ් රයිසනොව් ලූකාස්ට මේ පොත් දෙක කියවීමට අවසර ලබාදී තිබිණි. මේ කරුණු එස්.බී.ඩී. සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ඔහු

පාවිච්චි කළ මාක්ස්ගේ *Economic and Philososphical Manuscripts of 1844* කෘතිය ද මා වෙත දුන් අතර එයද ඔහු ඉතාමත් පරීක්ෂාවෙන් කියවා තිබෙන බවට සාක්ෂි තිබිණි.

ලංකාවේ සිටි දේශපාලන ආර්ථික විද්‍යාඥයින් අතර එස්.බී.ඩී. ගේ ඉහළම අගය කිරිමට ලක් වූ පුද්ගලයා වූයේ ජී.වී.එස්. ද සිල්වා ය. ඔහු එස්.බී.ඩී. ට වඩා වසර දෙකකින් බාල වූ අතර 1980 දී මිය ගොස් තිබිණි. එස්.බී.ඩී. තමන්ගේ කෘතියේ ප්‍රස්ථාවනාවේ දක්වන ආකාරයට තම කෘතිය මුද්‍රණය කිරීමට කලින් ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ අය අතර ජී.වී.එස්. ද සිටියි. (S.B.D de Silva 1992, viii) එස්.බී.ඩී. මාගේ පෞද්ගලික පාවිච්චිය සඳහා චාල්ස් අබේසේකර විසින් සංස්කරණය කරනු ලැබූ ජී.වී.එස් ගේ *The Alternatives: Socialism and Babarism* (1988) කෘතියද, පසුව සමාජ විද්‍යාඥයන්ගේ සංගමය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ජී.වී.එස් ගේ ලිපි ඇතුළත් *Poverty and People's Power* (2009) කෘතියද ලබා දුන්නේ ය. ඔහුගේ යෝජනාවක් පරිදි අප කීපදෙනෙක් එකතු වී ජී.වී.එස් ගේ ආර්ථික දර්ශනය ගැන සාකච්ඡා කරන අධ්‍යයන පන්තියක්ද සංවිධානය කළෙමු. 'Some Heretical Thoughts on Economic Development' ලිපිය අපි ගැඹුරින් සාකච්ඡාවට ලක් කළෙමු. මෙහි දී *මාවත* සඟරාවේ එළ වූ එහි සිංහල පරිවර්තනය වූ 'ආර්ථික සංවර්ධනය ගැන මිසදිටු මත කීපයක්' ලිපිය අපට මහෝපකාරී විය. ජී.වී.එස් ගේ මතවාදී පරිවර්තනයන් සම්බන්ධයෙන් එස්.බී.ඩී. විශේෂ අවධානය ලක් කළේය. ජී.වී.එස්. මාක්ස්වාදියෙකු වශයෙන් 1950 ගණන් තෙක් ඉතාමත් ක්‍රියාශීලි ලෙස ලංකා කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධව සිටි අතර න්‍යායාත්මක කාරණාවන් මත එයින් ඉවත් විය. ඔහු ජාතිකවාදී බලවේගයන්

සම්බන්ධයෙන් සංවේදී නොවීම කොමියුනිස්ට් ව්‍යාපාරයේ අඩුවක් වශයෙන් පී.වී.එස්. හඳුනාගත් අතර සමාජවාදී දිශානතියක් කරා ලංකාව තල්ලු කිරීමේදී ජාතිකවාදී ව්‍යාපාරයන්ට යම් විභවතාවක් ඇතැයි හඳුනා ගත්තේ ය. එයට න්‍යායාත්මක සහයක් දීම ඔහුගේ අපේක්ෂාව වී තිබේ. කෙසේ නමුත් මේ අදහසින් ද ඔහු ඉවත් වී ඇත. පසුව ඔහු ග්‍රාමීය ප්‍රදේශ වලට ගොස් සමාජ විපර්යාසයක් බලාපොරොත්තුවෙන් එහි ක්‍රියාත්මක වී ඇත. ග්‍රාමීය නිෂ්පාදන බලවේග වර්ධනය කිරීම ඔහුගේ ප්‍රධාන අපේක්ෂාව වී ඇත. ප්‍රාග්ධනය හා තාක්ෂණය ග්‍රාමීය අංශයට යෙදවීම සමාජයේ පරිවර්තනයක් සඳහා අවශ්‍යය. නමුත් දියුණු වෙමින් පවතින රටවල රාජ්‍ය, බුෂුවා පන්තිය හා නිලධාරි තන්ත්‍රය තමන්ගේ පැවැත්ම නාගරික අංශයේ දියුණුව මත පදනම් කරගෙන ඇත. මේ මත පදනම් ව එස්.බී.ඩී. නගරයේ ජීවිතය ග්‍රාමීය ආර්ථිකය මත පදනම් වී ඇති ආකාරය ගැන තවදුරටත් සොයා බැලුවේ ය.

එස්.බී.ඩී. සමකාලීනව ලංකාවේ දේශපාලන ආර්ථිකය ගැන සංවේදී අය ලියන කියන දේ ගැන ද උනන්දුවක් දැක්වූයේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මහනුවර දී එවන් අයට ආරධානා කර සාකච්චාවන් පැවැත්වීමට ඔහු යෝජනා කළේය. අප විසින් මුලින්ම ආචාර්ය නිමල් සඳරත්නට ආරධානා කරමින් සාකච්චාවක් පැවැත්වූ අතර දෙවනුවට එස්.බී.ඩී.යෝජනා කළේ සමාජවාදී සමානතා පක්ෂයේ නන්ද වික්‍රමසිංහ ය. කෙසේ නමුත් යම් හේතුවක් නිසා ඔහු එම සාකච්ඡාවට පැමිණියේ නැත. මේ අයට අමතරව ඔහු ආචාර්ය සමන් කැලේගම, ආචාර්ය උස්වත්ත ආරච්චි හා මහාචාර්ය සුමනසිරි ලියනගේ යන අයගේ නම් යෝජනා වූ නමුත් එම සාකච්ඡාවන් අපට සංවිධානය කිරීමට නොහැකි විය.

මා කලක් විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය සම්බන්ධව වැඩ කරන කාලයේ දී නික් බීම්ස් ගැන මුල්වතාවට දැනගන්නට ලැබුණු

අතර ඔහුගේ නිෂ්පාදනයේ භූගෝලීයකරණය පිළිබඳ ප්‍රවාදය ගැන කියවූයෙමි. එස්.බී.ඩී. සමඟ සාකච්ඡාවන් කෙරෙන කාලයේ දී ඔහුට මම නික් බීම්ස් ගැන විස්තර කළ විට ඔහුගේ ඉංග්‍රීසි ලිපි ලේඛන හා පොත් පත් කියවීමට එස්.බී.ඩී. ට අවශ්‍ය විය. ඒවායින් සමහරක් ලබාදුන් අතර ඔහු ඒවා සියල්ලම කියවා තිබිණි. පසුව ඔහු පාවිච්චි කළ අර්නස්ට් මැන්ඩෙල්ගේ *Late Capitalism* කෘතිය මට ලබා දුන් අතර ඔහුගේ අදහස වූයේ නික් බීම්ස්ගේ සමහර අදහස් මැන්ඩෙල් ද යම් දුරකට වර්ධනය කර තිබෙන බව ය. පසුව මැන්ඩෙල් විසින් මාක්ස්ගේ ප්‍රාග්ධනය කෘතියේ පෙන්ගුයින් ප්‍රකාශනයට ලබා දී ඇති පිටු 80 ක පමණ දීර්ඝ හැඳින්වීම ඔහුට ලබා දුන් අතර එය විශිෂ්ඨ හැඳින්වීමක් ලෙසට එස්.බී.ඩී. වර්ග කළේ ය. කෙසේ නමුත් ඔහු මෙවැන්නක් ප්‍රකාශ කළේ යඃ ''මේ අය ලෝක ආර්ථිකය සම්බන්ධයෙන් හොඳ විග්‍රහයන් කර තිබෙනවා. නමුත් ලංකාවේ ආර්ථිකයේ සත්‍ය ස්වභාවය ගැන ලියවී නැත.'' මෙහි දී ඔහු ජී.වී.එස්. ව අගය කළේ ය. එස්.බී.ඩී. ගේ ප්‍රධාන ව්‍යාපෘතිය වූයේ ලංකාවේ ආර්ථිකය ගැන ලිවීම ය.

ඔහු යම් යම් විකල්ප මාක්ස්වාදී ව්‍යාපාරවල අදහස් සම්බන්ධයෙන් ද සංවේදී විය. මේවායේ සාමාජිකයන්ව තම නිවසට සැඳවා ඔවුන්ගේ අදහස් ගැන විමසීම් කළේය. අප විසින් කරන ලද සඟරාවල අන්තර්ගතය වන්නේ මොනවාදැයි සමහර අවස්ථා වලදී විමසීම් කර ඇති අතර මනෝවිශ්ලේෂණය ව්‍යුහවාදය, විසංයෝජනය, කතිකා න්‍යාය ආදි තේමාවන් මේවායේ අන්තර්ගත යැයි මා අවස්ථා කීපයක දී ඔහුට පවසා ඇත. එහිදී ඔහු කීවේ මෙවැන්නකි. ''මේ විෂයන් වැදගත් වෙන්න පුළුවන්. නමුත් මාක්ස්වාදී ව්‍යාපාර වලට මේ විෂයන් වැදගත් වන්නේ කෙසේද යන්න නිවැරදිව පෙන්වා දිය යුතු බව ය.'' වරෙක ඔහු මනෝ විශ්ලේෂණය ගැන ට්‍රොස්කිගේ ඇගයුමක් ගැන සඳහන් කළේය. ඔහු

දැක්වූ ආකාරයට ට්‍රොස්කි, ෆ්‍රොයිඩ්ට ඇලුම් කර ඇත. මෙය ලෙනින් තුළ දැකගත නොහැකි ලක්ෂණයකි. බෝල්ෂේවික් නායකත්වය තුළ ට්‍රොස්කි, ෆ්‍රොයිඩ්ට වැඩි කැමැත්තක් දක්වා ඇත. ඇඩොල්ෆ් යොෆ් මුල්වතාවට වියානා වලදී ට්‍රොස්කිට මනෝ විශ්ලේෂණය හඳුන්වාදී ඇත. මා පසුව එස්.බී.ඩී.ට අනුව යමින් ට්‍රොස්කි හා මනෝවිශ්ලේෂණය අතර සබඳතාව සොයන්නට පෙළඹුනෙමි. ට්‍රොස්කිගේ *Literature and Revolution* කෘතියේ ෆ්‍රොයිඩියානු වාදය විද්‍යාත්මක භෞතිකවාදය සමඟ සංඝත බව දක්වා ඇත. ට්‍රොස්කිගේ *My Life* කෘතියේ මෙවැන්නක් සොයා ගත හැකි ය.

> ප්‍රව්දාවට මගේ ප්‍රධාන ලියුම්කරු වූයේ පසු කලෙක ප්‍රකට සෝවියට් රාජ්‍ය තාන්ත්‍රිකයකු වූ ඒ. ඒ. යොෆ් ය. අප මිත්‍රත්වයේ ආරම්භය වූයේ වියෙනා දිනයන් ය. යොෆ් දැවැන්ත බුද්ධිමය උද්‍යෝගී බවකින් යුතු මිනිසෙකු වූයේ ය. ඔහු සියළු පෞද්ගලික සබඳතාවලදී ප්‍රසන්න වූයේය. ව්‍යපාරයට නොසැලෙන සුළු ලෙස පක්ෂපාති වූයේය. එහු ප්‍රව්දාවට මුදල් සහ ඔහුගේ මුළු ශක්තිය ලබා දුන්නේ ය. ඔහු ස්නායු ආබාධයකින් පෙළුනේ ය. එකළ ඔහුව මනෝචිකිත්සාවට බඳුන් කළේ ප්‍රොයිඩ්ගේ ශිෂ්‍යයකු ලෙස පටන්ගෙන පසු කළෙක සිය ගුරුවරයාට විරුද්ධව තමන්ගේම පෞද්ගලික මනෝවිද්‍යාත්මක ගුරුකුලයක් පිහිටුවාගත් ඇල්ෆඩ් ඇඩ්ලර් ය. යොෆ් හරහා මම මනෝ චිකිත්සක ගැටළු දැන හඳුනා ගත් අතර එය මා මෝහයට පත් කළේ ය. එය විහිළු සහයක සහ හිතුවක්කාරි අදහස්වලට මාවත විවෘත කරයි (ටී. අන්ද්‍රදි, 2009.පිටු 308).

එස්.බී.ඩී. වරෙක මෙවන් අදහසක් එළ කළේ ය. යම් සුවිශේෂී රටක මාක්ස්වාදී ව්‍යාපාරය විසින් ඒ රටේ සැබෑ දේශපාලන ආර්ථිකය ගැන හැදෑරීමක් කළ යුතු ය. මෙහිදී ඔහු උදාහරණයකට ගත්තේ ලෙනින්ගේ *The Development of Capitalism in Russia* ය ලෙනින්ට තම රටේ ධනේශ්වර ක්‍රමයේ වර්ධනය ගැන හොඳ අවබෝධයක් තිබුණු අතර විප්ලවයට කලින් මේ හැදෑරීම කර තිබිණ. ලංකාවේ මාක්ස්වාදී සංවිධානයන්ද මෙවැනි උත්සාහයක් දැරිය යුතු ය. මෙහිදී ඔහු පොත් කීපයක් ගැන තොරතුරු ලබා දුන්නේ ය. එංගලස්ගේ *The Condition of the Working Class in England*, මොරිස් ඩොබ්ගේ *Studies in the Development of Capitalism*, ඊ.පී. තොම්සන්ගේ *The Making of the English Working Class*, මාක්ස්වාදී ඉතිහාසඥයන් වූ ක්‍රිස්ටෝපර් හිල්ගේ පොත් සහ හොබ්ස්බොම්ගේ *The Age of Capital* හැදෑරිය යුතු පොත් වශයෙන් නම් කළේ ය.

එස්.බී.ඩී. පරිඝනක ලෝකයට සහ අන්තර්ජාල ලෝකයට ප්‍රවේශ වී සිටියේ නැත. ඔහු පොත්පත් වල වැඩ කළේ පැන්සලෙන් හා මකනයෙනි. තුනී ලෑල්ලක් මත කඩදාසි තබාගෙන පුටුවේ ඉදගෙන වැඩකිරීම ඔහුගේ සිරිත ය. මම කතිකා න්‍යායේ ඓතිහාසික වර්ධනය ගැන ලියන විට ඔහු ඊට කැමැත්තක් දැක්වී ය. ඊට ප්‍රධාන හේතුව වූයේ කතිකා න්‍යාය යථානුභූතවාදයට, නිර්ණයවාදී හා ඌනතවාදී විධික්‍රමයන්ට එරෙහි එකක් වීම ය. කතිකාව වනාහි ඒකාබද්ධකරන භාවිතයක ප්‍රතිඵලයක් වශයෙන් ගොඩ නැගෙන ව්‍යුහාත්මක සමස්ථයක් යැයි අර්ථකථනය කරන විට සමස්ථය පිළිබඳ අදහසට ඔහු ඇදී ගියේ ය. කතිකා න්‍යායට ඇති ප්‍රංශ දාර්ශනික මූලයන් හා 1968 ප්‍රංශ ශිෂ්‍ය සටන් ගැන සාකච්ඡා කරන විට ඔහු නිර්දේශ කළ කෘතියක් වූයේ හොබ්ස්බෝම්ගේ *Revolutionaries* ය. මාගේ දර්ශනපති නිබන්ධයේ දී

මා විසින් වඩාත් අවධාරණයට ලක් කළේ අර්නස්ටෝ ලැක්ලව් 1986 දී ලියූ *Hegemony and Socialist Strategy* කෘතිය වූ නමුත් ඊට පෙර ලැක්ලව්ගේ සමහර දේශපාලන ආර්ථික මතවාදයන් ගැන එස්.බී.ඩී. කියවා තිබිණි. ඔහු 1983 දී Ankie Hoogvet ගේ *The Third World in Global Development* කෘතියට *Third World Planing Review* (Vol 5, No 3) හි ග්‍රන්ථ විචාරයක් කර තිබිණි. මේ විචාරයේදී ලැක්ලව්ගේ නමද සඳහන් කර ඇත. එමෙන් ම ලැක්ලව්ද සංස්කාරකයකු වූ *Economy and Society* සඟරා කීපයක් ඔහු මට ලබා දුන්නේය.

**ජීවිත පිළිවෙළ**

ඔහු, මා සම්බන්ධව සිටි දේශපාලන සංවිධානයක කොළඹ හා නුවර නිවෙස් වලට වතාවන් කීපයක්දීම පැමිණ රාත්‍රියද ගෙවා ඇත. ඔහු එක් වරෙක ඉතාමත් වටිනා පොත් තොගයක් පොත් රාක්කයක් සමඟින් නුවර සංවිධානයට පරිත්‍යාග කලේ ය. එම පොත් සංවිධාන සාමාජිකයන් කියවනවාදැයි නිරන්තර අවධානයෙන්ද සිටියේ ය. ඔහු වඩාත් කැමති වූයේ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට හා අදහස් ප්‍රකාශ කිරීමට ය. සමහර අවස්ථාවලදී ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට අපහසු අයට එම දුෂ්කරතාව මග හරවා ගැනීමට ඔහු උදව් කලේ ය. ඔහු වැඩ කරන පිළිවෙළ සංවිධාන සාමාජිකයන්ට කියා දීමටත් ඔහු උත්සුක විය. පිලිවෙළට පුවත්පත් ලිපි එකතු කරන ආකාරය වර්ග කරන ආකාරය, තොරතුරු රැස්කරන ආකාරය, පුහුණු කිරීමට ඔහු උනන්දු විය. ඔහු එකතු කළ පුවත්පත් විශාල ප්‍රමාණයක් අප සංවිධානයට ලබා දුන්නේය. සංවිධානයේ නිවසේ බිම පැදුරක් එලාගෙන හෝ නිදා ගැනීම ඔහුට ප්‍රශ්නයක් වූයේ නැත. පොත් පත් කියවන ආකාරය පමණක් නොව උයන පිහන ආකාරයත්, කුස්සිය පිළිවෙළට තබා ගන්නා ආකාරයත්, ගෙවත්ත පිලිවෙළට සකසා ගන්නා ආකාරයත්, ගැන උපදෙස් දීම

ඔහුගේ සිරිතය. මේ වැඩ කටයුතු වලදී ඔහුත් ඒවාට ප්‍රායෝගිකව හවුල්වීම සුවිශේෂ ලක්ෂණයකි.

ඔහුගේ කුණ්ඩසාල නිවසෙහි හා ගෙවත්තෙහි යම් අපිලිවෙළක් ඇති වූ විට ඔහු බොහෝ විට අපට කතා කළේ ය. අප කිහිප දෙනෙක් එකතු වී එය පිලිවෙළගත කිරීමට අවස්ථා කිහිපයකදිම සහභාගීවී ඇත. එවන් දිනවලදී කෑම පිලියෙළ කරන්නේ ඔහුය. ඔහු කෑම පිසිමට අතිශයින්ම දක්ෂ ය. කෑම පිසීම සඳහා අවශ්‍ය තුනපහ ඇතුළු සියළු දේවල් ඔහු නිශ්චිත තැන්වල තබා ඇති අතර කව්රු හෝ කෙනෙක් ඒවා අවුල් කළොත් ඔහු අතිශයින් කේන්ති ගත්තේය. ඔහු ලංකාවේ ගෘහනියන්ට කරන චෝදනාවක් නම් ඕනෑවට වඩා ව්‍යංජනයන් තැම්බීම ය. එවිට එළවළුවල රසයත් ගුණයත් යන දෙකම අහෝසි වේ. ලංකාවේ හොඳම තේ වැවවත් ලංකාවේ මිනිසුන් තේ බීමට දන්නේ නැතැයි ඔහු චෝදනා කළේ ය. තේ වලට ඕනෑවට වඩා සීනි දැමීම නිසා නැවුම් තේ රස අහෝසි කරගන්නා බවට ඔහු චෝදනා කළේය. ලංකාවේ මිනිසුන් සුදු සීනි සහ සුදු පිටි කෑමට පුරුදුව සිටින බවත් එහි ගුණයක් නොමැති බවත් ඔහුගේ අදහස ය. අපට ආටාපිටි වලින් කෑම පිලියෙළ කරගන්නා ලෙසට ඔහු නිතරම උපදෙස් දී ඇත. ඔහු මහනුවර නගරයේ අස්සක් මුල්ලක් නෑරම දන්නා අතර වඩාත් හොඳ එළවළු කෝපි, කඩදාසි ඇති තැන් හොඳින් දනී. අපටත් ඒ තැන් පෙන්වා දීම ඔහුගේ සිරිත ය.

ඔහු සෑම දෙයක් සම්බන්ධයෙන් ම පුදුමකාර පිළිවෙළක් නඩත්තු කළේ ය. ඔහුගේ ගෙදර යම්කිසි අපිළිවෙළක් තිබුණොත් එදින කිසිම කෙනෙකුට තමන්ගේ නිවසට ආරධනා කරන්නේ නැත. ඔහු යම් කිසි හමුවක් යොදා ගත්තොත් නිශ්චිත වෙලාවටම පැමිණීම පුරුද්දක් වශයෙන් කළේ ය. ඔහුගේ වයස 90 කට ආසන්නව පැවති කාලයේදීත් ඔහු ගමන් බිමන් ගියේ පොදු ප්‍රවාහන සේවයේ ය. ඔහු බසයකට

නැගීමේදී, බැසීමේදී පමණක් නොව පාරේ ඇවිදීමේදී පවා අතිශයින්ම පරිස්සම්කාරි ය. ඔහු වසර 92ක් පමණ ඉතාමත් නිරෝගි ලෙස ජීවත් වූයේ මේ පරිස්සම්කාරි බව නිසාම ය. ඔහු පාන්දර 3.30ට පමණ අවදි වී වැඩ කළ අතර වේලාසනින් නින්දට ගියේ ය.

**උපහාසය**

ඔහු කිසිම කෙනෙකුට අපහාස නොකළ නමුත් බොහෝ අවස්ථාවලදී උපහාසාත්මක විය. මිනිස්සු තමන්ගේ සත්‍යය ධාරිත්වන්ට වඩා එළියට පෙන්වන ව්‍යාජ ධාරිතාවන් ගැන ඔහු උපහාසාත්මක විය. ඔහු පුවත්පත් රූපවාහිනී සාකච්ඡාවලට කැමත්තක් නොදැක්වූ අතර පුද්ගලයන්ට කරන ඊනියා උපහාර ගණන් ගත්තේ නැත. සමහර උගතුන් ගෝලයන් යොදවා තමන්ටම කරන උපහාර ග්‍රන්ථ ගැන උපහාසයෙන් යුක්තව ඔහු කතා කළේ ය. දිගින් දිගට තර්කයක් නොමැතිව පොත් මුද්‍රණය කරන අය ගැන ඔහු කියා සිටියේ ඒ අය කැලැන්ඩර් ගසනවා සේ පොත් ගහනවා කියා ය. තවත් අය විවිධ මාතෘකා ගැන පොත් ලියා එස්.බී.ඩී. ගෙන් පෙරවදන්, පසුවදන් ලියා ගැනීමට උත්සාහ කළ විට ඔහු මඟහැරියේ ඒ අය තමන්ව වෙනත් අරමුණු සඳහා පාවිච්චි කිරීමට ඉඩ ඇති බව ඔහු දන්නා නිසා ය. වරක් ඔහු අසනීප තත්වයක් නිසා පේරාදෙණිය රෝහලේ නතර වී සිටි බව ආරංචි වී මා ඔහුව බැලීමට ගිය අතර, ඔහු එහිදී කියා සිටියේ තමන් බැලීමට ඒම අවශ්‍ය නැති බවත් දොස්තර මහත්වරු සහ නර්ස් නෝනලා ගමන්ව හොඳට බලාගන්නා බවත් ය. තවත් වරෙක මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන වකුගඩු ආබාධයක් නිසා මහනුවර මහ රෝහලේ නේවාසික ප්‍රතිකාර ගන්නා බව ආරංචි වී ඔහුව බැලීමට යමු යැයි එස්.බී.ඩී. යෝජනා කළ අතර අප දෙදෙනා රෝහලේ වාට්ටුවෙන් වාට්ටුවට ගොස් ඔහු සිටින තැන පරීක්ෂා කළෙමු. අපට ඔහුව සොයාගැනීමට නොහැකි විය. අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයට දුරකථන පණිවිඩයක් දී මේ ගැන විමසූ

විට අපට දැනගන්නට ලැබුණේ බාහිර අය ලෙස්ලි ගුණවර්ධනව බැලීමට ඒම සම්බන්ධයෙන් ඔහු කැමැත්තක් නොදක්වන බව ය. මම එහිදී එස්.බී.ඩී. වරක් කියූ දෙයක් ඔහුට මතක කළෙමි. "ලෙස්ලි ගුණවර්ධනව දොස්තර මහත්වරු සහ නර්ස් නෝනලා හොඳට බලා ගන්නවා ඇතිනේ". එවිට එස්.බී.ඩී. හඬනඟා සිනාසුණේ ය.

අපි ඔහුට කතා කළේ එස්.බී.ඩී. සර් කියාය. නමුත් ඔහු වරෙක කියා සිටියේ තමන් නැති තැන තමන්ට සර් කියා කීමට අවශ්‍ය නොවන බව ය. වෙනත් අයෙකුටත් සර් කියා ඇමතීමට අවශ්‍ය නම් ඔහු අභිමුඛයේ එසේ කීව්වත් ඔහු නැති තැනක එසේ කීමට අවශ්‍ය නොවන බව ය.

ඔහු ඉහළට නංවා ඇති අධ්‍යාත්මවාදයන් හා අවිහිංසාවාදයන් ගැන උපහාසාත්මක විය. ඔහු වරෙක කීවේ ගාන්ධිගේ අවිහිංසාවාදය නඩත්තු කිරීමට ඉන්දියානු ආණ්ඩුව සෑහෙන්න වියදම් කළ බව ය. ඔහුට අනුව රුසියාවේ විප්ලවයෙන් පසු ලෙනින් ඉදිරියේ සමහර රුසියානු මිනිසුන්ට වැඩ නැතැයි පැමිණිලි කළ විට ලෙනින් කියා ඇත්තේ ඒ මිනිස්සු වැඩ නැති අය නොව වැඩකට නැති මිනිසුන් බව ය.

එස්.බී.ඩී. 2013 එක්තරා දිනක මා සමඟ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පැමිණියේ ය. ඔහු අවසන් වතාවට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පැමිණියේ එදින යැයි සිතමි. එසේ පැමිණියේ ඉතිහාසය අංශයේ මහාචාර්යවරයකු වූ පී.වී.ජේ. ජයසේකර හමුවී ඉතිහාසය පිළිබඳ කාරණාවන් කීපයක් කතා කර ගැනීමට  ය. මේ කතා බහ අවසන් කර මා සමඟ ආපසු යාමේදී විශ්වවිද්‍යාලයේ තැන්තැන්වල නවත්වා ඇති මෝටර් රථ පෙන්වමින් ඔහු මෙවැන්නක් කීවේය. "දැන් විශ්වවිද්‍යාලයේ උගන්වන අයගේ ආශාව තියෙන්නේ ශාස්ත්‍රීය දේවල් වලට වඩා වාහන, ගෙවල් දොරවල් ගැන ය; ගොඩක් අය විවිධාකාරයේ ව්‍යාපාරික කටයුතු

කරමින් ඉන්නේ". ඔහු මහාචාර්ය මයිකල් රොබට්ස්ව ආවර්ජනය කරමින් මෙසේ කීවේය. "මයිකල් රොබට්ස් ශාස්ත්‍රීය දේවල් වලට හරිම උනන්දුයි. පුදුමාකාර විධියට කැපවෙනවා. ඔහු කලා පීඨයේ උසස්ම ගණයේ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ ගණනාවක් සංවිධානය කලා. ඔහු කොළඹ ලේඛනාගාරයට මහනුවර ඉදලා යන්නේ මෝටර් බයිසිකලයෙන්. සැප කාර් හෙව්වේ නැහැ." එස්.බී.ඩී. කළෙක මැලේසියාවේ විශ්වවිද්‍යාලයක ඉගැන්වීම් කටයුතු කළ අතර ඔහු කියා සිටියේ එසේ වැඩ කරන කාලයේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට එම විශ්වවිද්‍යාල නගරයෙන් පිටතට යාමටවත් ඉඩ නොදෙන බව ය. විශ්වවිද්‍යාලයේ අඳාළ දෙපාර්තමේන්තුවේ තමන්ට දී තිබෙන කාමරයට ඇතුළු වී ඕනෑම රාත්‍රියක වුවත් වැඩකිරීම සඳහා වෙනම යතුරක් දී තිබෙන බවත් ඔහු කියා සිටියේය. නමුත් ලංකාවේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ළමයින්ටත් වඩා 'home work' තිබෙනවා යැයි ඔහු උපහාසයෙන් කියා සිටියේ ය.

එස්.බී.ඩී. මුළු ජීවිත කාලය තුළම අධ්‍යයනය කළේ ලංකාවේ භෞතික හා වාස්තවික තත්ත්වයන් පිළිබඳව ය. කෙසේ නමුත් ඔහුත් ආත්මීය ප්‍රශ්න කීපයක සිරවී සිටියේ ය. මෙහිදී සමහරුන් උපහාසාත්මකව කියා සිටියේ ලංකාවේ දේශපාලන ආර්ථිකය ගැන හරියටම දන්නා මිනිසාට සමහර ආත්මීය ප්‍රශ්න තේරෙන්නේ නැති බවට ය. සමහර අවස්ථාවලදී පැන නැගුණු ආත්මීය ගැටළු විසදා ගැනීමට මාගෙන්ද උදව් ඉල්ලා ඇත. අවස්ථා කිහිපයකදීම ඊට මැදිහත් වුනෙමි. නමුත් පසුව මට තේරුම් ගියේ ඇත්ත වශයෙන්ම ඒවා විසඳා ගැනීමට ඔහුටත් අවශ්‍යතාවයක් නැති බව ය. ආත්මීය ගැටළු විසඳා ගැනීමට ඇති උනන්දුව පෙන්වුවත් එම ආත්මීය ගැටළු දිගින් දිගටම නඩත්තු කිරීමට අපි අවිඥාණිකව ආශා කරමු. අපි බොහෝ විට පෙළඹෙන්නේ යමෙකුට යම් ආත්මීය ප්‍රශ්න් නොතිබුණානම් ඔහු පරිපූර්ණ මිනිසකු වන බවට ය.

නමුත් සත්‍යය එය නොවේ. යමෙකුගේ සමස්ත ඒකාබද්ධතාව ගොඩනැගී තිබෙන්නේ තමන්ටම සවිඥණික කරගත නොහැකි කලු කුහරයක් වටා බව ය. ඕනෑම සබුද්ධික ආලෝකයක් පිටුපස අඳුරක් ඇත. එවන් නිෂේධනමය තත්ත්වයන් (negativity) තිබෙන බව අවබෝධ කරගැනීමට ඉහළ දාර්ශනික පුහුණුවක් තිබිය යුතුය. මේ ආකාර ප්‍රශ්න තේරුම් ගැනීම සඳහාම මට මාගේ ආචාර්ය උපාධියට තෝරා ගත් ක්ෂේත්‍රය වූයේ මෙම නිෂේධනය පිළිබඳ සංකල්ප ය.

එස්.බී.ඩී. මුද්‍රණය කළේ තමන් හැදෑරූ ක්ෂේත්‍රයෙන් ඉතාම සුළු කොටසක් පමණි. නමුත් ඔහු කඩදාසි පිටු දහස් ගණනක් ලීවේ ය. ඔහු පොත්පත් ලිපි ලේඛන දහස් ගණනාවක් කියෙව්වේ ය. පේරාදෙණිය විශ්වාලයේ ප්‍රධාන පුස්තකාලයේ ශාස්ත්‍රීය සඟරාවලට වෙන් වූ එක් තට්ටුවක්ම ඇත. එස්.බී.ඩී. බොහෝ අවස්ථාවල තමන්ට අවශ්‍ය පොත් පත් හා ලිපිවල ඡායා පිටපත් මා ලවා ගෙන්වා ගෙන ඇත. මේ පොත් පරීක්ෂා කිරීමේදී ඒවා පළමු වතාවටත් දෙවන වතාවටත් කියවා තිබෙන්නේ ඔහු පමණක් බව මට පැහැදිළි විය. ඔහු ලියූ දේවල් මුද්‍රණය කරමු යැයි මා අවස්ථා කීපයක දී ම ඔහුගෙන් ඉල්ලීම් කර ඇත. නමුත් ඒ සෑම විටකදීම ඔහු කියන්නේ ඒවා තවදුරටත් වර්ධනය කළ යුතු බවත් පිරිපහදු කළ යුතු බවත් ය. ඔහු ලියූ සෑම වාක්‍යයක්ම අතිශයින්ම වටිනා බවත් ඒවා තවදුරටත් පිරිපහදු කිරීමට අවශ්‍ය නැති බවත් මට තේරුම් ගියත් ඔහුගේ පැත්තෙන් ඊට උනන්දුවක් දැක්වූයේ නැත. මේවා එල කිරීම දිගින් දිගටම කල් යාමත්, ඔහු ක්‍රමානුකූලව වයසට යාමත් නිසා ඔහුගේ ලිපි ලේඛන අනාරක්ෂිත බව මට වැටහිණි. එක්තරා අවස්ථාවකදී ඔහුගේ *Political Economy of Under development* කෘතිය සිංහලට පරිවර්තනය කිරීමට මහාචාර්ය සුචරිත ගම්ලත් කැමැත්තෙන් සිටිනවා යැයි මට දැනගන්නට ලැබුණු අතර ඒ ගැන එස්.බී.ඩී. සමඟ පැවසුවෙමි. එහිදි ඔහු කියා සිටියේ සිංහලට පරිවර්තනය කිරීමේ තේරුම කුමක්ද

යන්නයි. 2011දී ඔහුගේ කෘතිය දෙවන වරට Routledge ප්‍රකාශකයන් ප්‍රකාශනයට පත් කර තිබිණි. ආසන්න වශයෙන් වසර 30කට පමණ පසුව මෙම දෙවන මුද්‍රණය පිට වී තිබිණි. මේ වසර 30 කාලය තුළ ඔහු එම කෘතියෙන් කියන්නට උත්සාහ ගත් දේ තවදුරටත් වර්ධනය කර තිබිණි. අවසන් වරට ඔහුව මුණගැසුණු දිනයේදී මෙම අලුත් මුද්‍රණයට නව හැඳින්වීමක් කළේ නැත්තේ ඇයිදැයි ඔහුගෙන් විමසා සිටියෙමි. ඔහු සියුම් සිනහවක් එල කලා මිස ඊට පිළිතුරක් ලබා දුන්නේ නැත.

කෙසේ නමුත් ඔහු ලියූ හැදෑරූ දේවල් විනාශ වී ගියොත් එය අතිශයින්ම කනගාටුවට කාරණයකි. Herman van Breda නම් ෆ්‍රැන්සිකානු දාර්ශනික පූජකයා තම ආචාර්ය උපාධියට කල නිබන්ධනය එඩ්මන්ඩ් හුසල්ගේ ප්‍රපංච විද්‍යාව ගැනය. නාසින් 1930 ගණන් වලදී යුදෙව් හා මාක්ස්වාදී උගතුන් ලියූ පොත්පත් ගිනිබත් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර තිබූ අතර මේ පූජකයා නොසිටින්නට හුසල් විසින් ලියූ පිටු 40,000 ක් පමණ අත්පිටපත් විනාශ වෙනවා නොඅනුමාන ය. මේ පූජකයා හොර රහසේ හුසල්ගේ ලිපි ලේඛන හා අත් පිටපත් ජර්මනියේ ෆ්‍රිබර්ග් විශ්වවිද්‍යාලයේ සිට බෙල්ජියමේ Leuvne විශ්වවිද්‍යාලයට රැගෙන ආවේ ය. මේ ලිපි ලේඛණ හුසල්ගේ සහයකයකු වූ ඉයුජින් ෆින්ක් ලවා සංස්කරණය කර ගත් අතර දෙවන ලෝක යුද්ධය ආරම්භ වූ කාලයේ හුසල්ගේ ලිපි ලේඛණ තබා තිබුණේ Leuvne විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ ය. 1940 මැයි 17 වන දින පුස්තකාලය ගින්නකින් දැවී අලුවී ගියේය. නමුත් වාසනාවකට ඊට සතියකට පෙර මෙම පූජක දාර්ශනිකයා හුසල්ගේ ලිපි ලේඛණ දාර්ශනික උසස් ආයතනයට ගෙන ගොස් තිබිණි. දෙවන වතාවටත් ඔහු හුසල් ලේඛනයන් බේරා ගත්තේය. මාලියෝ පොන්ටේ, ඩෙරිඩා වැනි අයගේ දාර්ශනික පිබිදීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ දෙයක් වූයේ හුසෙල්ගේ ලිපි ලේඛණ කියවීම ය. ඔවුහු

Leuvne වල ඇති හුසල් ලේඛණාගාරයේ සෑහෙන කාලයක් මේ ලිපි ලේඛන කියවීමේ නිරත වූහ. හේගල් තමන්ගේ දේශන පිටපත් තම ශිෂ්‍යයන්ට ඉතුරු කළ අතර හෙගල්ගේ මරණයෙන් පසු *Philososphy of History, Philososphy of Art, Histroy of Philososphy* පොත් එළ වූයේ මෙම ශිෂ්‍යයන්ගේ උත්සාහය නිසාය. නමුත් එස්.බී.ඩී. ලියූ දේවල් සංස්කරණය කර එළ කිරීම අවිනිශ්චිතය. බොහෝ දුරට ඒවා විනාශ වී යාමට ඉඩ ඇත.

එස්.බී.ඩී. ගේ විෂයට කිසිදු සබඳතාවක් නැති බුදුදහම සම්බන්ධයෙන් විශිෂ්ඨතම පැහැදිලි කිරීම් කළ කටුකුරුන්දේ ඥාණානන්ද හිමියෝ තමන් ගොඩනැගූ සියළු අදහස් ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් ලියා මුද්‍රණය කර නොමිලේ ම බෙදා හැරිය හ. කිසිදු ප්‍රසිද්ධියක් බලාපොරොත්තු නොවූ උන්වහන්සේ පිටරටවල ඉතාම දියුණු විශ්වවිද්‍යාලවල ඉගැන්වීමට ආරාධනා ලැබුණත් ලංකාවෙන් පිටතටවත් නොගොස් කිසිදු ජනමාධ්‍යයකටවත් නොගොස් තම ව්‍යාපෘතිය කරගෙන ගියහ. එස්.බී.ඩී. තමන් සිතූ සියළු දේ ලිව්වත් එළ කළේ නැත. ඔහුත් කිසිදු ප්‍රසිද්ධියක් බලාපොරොත්තු නොවූ අතර ජනමාධ්‍යයකටවත් ආවේ නැත. ක්ෂේත්‍ර දෙකක ඉතාමත් විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනෙක් ලංකාවේ සිටියාද යන්න දන්නේ සුළු පිරිසක් වන අතර මේ දෙදෙනා එකම වර්ෂයේ මිය ගිය බවත් දන්නේ ටික දෙනෙකි. ඔවුන් දෙදෙනාම සරල ජීවිත ගෙවා දැවැන්ත බුද්ධිමය හා ශාස්ත්‍රීය ලෝකයක් ගොඩනගා නිහඬව අවසන් ගමන් ගියහ.

මෙම ලිපියෙන් කියන්නට උත්සාහ ගත්තේ ලංකාවේ ජීවත් වූ විශිෂ්ඨ දේශපාලන ආර්ථික විද්‍යාඥයකුගේ ලෝක දැක්ම ය. එස්.බී.ඩී. ද සිල්වා ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් සාකල්‍යය ප්‍රවේශයක් ගෙන තිබෙන බව මෙහිදී විස්තර විය. මේ දැක්ම සකසා ගැනීමට අසීමිත

විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක සහ දාර්ශනික ක්ෂේත්‍රයන්ගේ සහය ලබාගෙන තිබෙන බව විස්තර කෙරිණි. ඔහුගේ දැක්ම යථානුභූතවාදය ඉක්මවා ගිය සමස්තය හා කොටස අතර අන්තර් සබඳතාව පිළිගත් දයලෙක්තිමය එකක් බව මෙහිදී පෙන්වා දුන්නෙමි. ඔහුගේ ජීවිත පිළිවෙළෙහි පැවති සුවිශේෂි බව මෙවන් ශාස්ත්‍රීය ලෝකයක් ගොඩනැගීමට පදනම දැමූ බව පෙන්වා දුන්නෙමි. ලංකාවේ දේශපාලන ආර්ථිකය හැදෑරීමේදී ඔහු ලබාදුන් ආරම්භය පදනමක් කර ගත යුතු බව මෙම ලිපියේ නිගමනය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

S.B.D. de Silva, (1993). 'Theoretical and Empirical Perspectives in the Social Sciences' in *Seminar Report: Social Science Research Methodology*, Natural Resources, Energy and Science Authority, pp. 38- 47.

S.B.D. de Silva, (1985). 'Plantation Investments in Sri Lanka' in *Capital and Peasant Production,* ed. Charles Abesekera, Social Scientists Association, pp. 33-32

S.B.D. de Silva, (1985). 'Plantation and underdevolpment' in *Capital and Pesant Production*, ed. Charles Abeysekara, Social Scientists Association, pp. 21-62

S.B.D.de Silva, (1983). 'The Third World in Global Development: A Review Article' in *Third World Planing Review*, Vol. 5, No 3, August, pp. 287-290.

S.B.D. de Silva, (1982). *The Political Economy of Underdevelopment*, London: Routledge.

ටී. අන්ද්‍රාදි (2009). *ලියොන් ට්‍රොට්ස්කිඃ මගේ ජීවිතය*, නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ